2022 අගෝස්තු
ISSN 25792369

# FORWARD

සටන් කරන තාරුණ්‍යයට



# අරගලය ඉවර නැත!



ඉතිහාසයේ තියෙන්නේ අපට ඉගෙනගන්න නිසා ගෝල්ෆේස් අරගලය කියන්නේ මිනිසුන්ගේ දේශපාලන හැසිරීම ගැන ඉගෙනගන්න ලැබුණු හොඳම අවස්ථාවක්. පාඩම් ඉගෙනගන්නවා කියලා කියන්නේ නරක අත්දැකීම් ගැන සමාලෝචනයක් විතරක්ම නෙවෙයි. හොඳයි කියන දේවල් තදින් වැළඳගැනීම පවා ඒ ඉගෙනුම්වලම කොටසක්!

මුලින්ම දෙතුන් සියයකින් පටන් ගත්ත අරගලයට කිසිම භේදයක් නැතුව දහස් ගණන් ගැහැණු-මිනිස්සු ඒකරාශී වෙන්න පටන් ගත්තා. තමන්ට දැනෙන පීඩනයට එරෙහිව නැගී හිටිය ඔවුන්ට අපේ ආදරය හිමිවිය යුතුයි. එතනදී ඔවුන්ට සිංහල දෙමළ හෝ මුස්ලිම් කියා භේදයක් තිබුණේ නැහැ. අරගලයේ හිටපු මිනිස්සු හැමෝම එකතුවෙලා රාමසාන් සැමරුවා. නෝම්බි උපවාස කාලය අවසන් කළා. වෙසක් උත්සවය සැමරුවා. ඒ වගේම පවුල් පිටින් ඇවිත් අරගලයට සහයෝගය දැක්වූවා. එන්න බැරි අය අරගලය වෙනුවෙන් තමන්ට හැකි පමණින් උදව් කළා. මාස තුනකට අධික කාලයක් පුරා විවිධ හැඩතල, වර්ණ, අත්දැකීම් සහ වටිනාකම් එකතුකර ගනිමින් අරගලය අඛණ්ඩව ඉදිරියට ආවා.

අදටත් සමහරු මේ අරගලය හඳුන්වන්නේ නිර්පාක්ෂික අරගලයක් කියලයි. ඒත් ඇත්තටම මේ යෙදුම සාධාරණද? නැහැ! කිසිසේත්ම නැහැ! සෘජුවම දේශපාලන මතයක් නොදරණ පිරිස් වගේම විවිධ දේශපාලන මතවාදයන් දරණ සහ විවිධ පක්ෂවලට ලැදියාවන් දක්වන සාතිශය බහුතරයක් දෙනාද සක්‍රියව අරගලයට දායක වුණා .ඒ නිසා මේ අරගලය බහුපාක්ෂික අරගලයක් බව ස්ථිරයි.

එවැනි මතවාද බොහෝ ප්‍රමාණයක් මේ අරගලය තුළදී අපි දැක්කා. නමුත් ඒ ගැන අපි පුදුම විය යුතු නැහැ. මේ අරගලය කියන්නේ නිශ්චිත සංවිධාන රාමුවකට හෝ අවසාන ඉලක්කයකට එකතු වුණු පිරිසක් නෙවෙයි. ඒ තුළ විවිධ අරමුණු සහිත පිරිස් සක්‍රියව කටයුතු කළා. ඒ අයගේ සටන්පාඨ වෙනස්, අරමුණු වෙනස්!.. ඉලක්ක හා උපක්‍රම වෙනස්!! නමුත් මුළු අරගලයමත් අරගලයට සහභාගි වූ සියලු දෙනාමත් එකට බැන්දවූ පොදු සාධකයක් තිබුණා.

ඒ තමයි මේ 74 වසරක දේශපාලනයට තිබුණු අකමැත්ත!. පාලක කල්ලි විසින් මේ දේශපාලනයට මුහු කරලා තිබුණු ජඩ දේශපාලන සංස්කෘතියටයි මිනිස්සු විරුද්ධ වුණේ. ඒ නිසා පුද්ගල මාරුවකට එහා ගිය, දේශපාලන ක්‍රමයේ හා සංස්කෘතියේ වෙනසක් මිනිස්සු ඉල්ලා සිටියා.

හැබැයි අද ඒ වෙනස ලැබිලාද කියන එක ගැටලුවක්. සමහරු හිතුවා ගෝඨා ගෙදර ගියාම ප්‍රශ්න විසඳෙයි කියලා. සමහරු හිතුවා රනිල් ආවහම ඩොලර් නැව් පිටින් ඇවිල්ලා ටක්කෙටම ප්‍රශ්න විසඳෙයි කියලා. රනිල්ට අගමැති වෙලා විසඳන්න බැරිවුණ ප්‍රශ්න, ජනාධිපති උනහම විසඳන්න පුළුවන් වෙයි කියලත් සමහරු හිතුවා. ඒත් අදත් දවසගානේ මිනිසුන්ගේ හීන මියැදෙමින් තිබෙනවා. හීන විතරක් නෙවෙයි, මුලු රටම දවසෙන් දවස මියැදෙමින් තිබෙනවා. ඒ නිසා මේ පටන්ගත්ත අරගලය අපි වඩාත් ශක්තිමත්ව අරගෙන යන්න, ඒ වෙනුවෙන් නැගිටින්න ඕන කාලය එළඹිලා තියෙන්නේ දැනුයි!...

මොකද අද තියෙන්නෙ ලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ, රටේ ජනතා පරමාධිපත්‍යයේ සැබෑ ඉල්ලීමට පයින් ගහලා කරපු මාළිගා කුමන්ත්‍රණයක කූටප්‍රාප්තියක්. දූෂිත රාජපක්ෂ පවුලට හා ඔවුන්ගේ ජඩ දේශපාලනයට රැකවරණය දිය හැකි හොඳ මිතුරෙක්ව ඔවුන් විසින් අද රටේ ජනාධිපතිවරයා බවට පත් කරලා තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ මැතිවරණයෙන් එකදු ආසනයක්වත් දිනාගන්න බැරි වුණු, ලැබුණු එකම ජාතික ලැයිස්තු මන්ත්‍රීධුරයත් අවුරුද්දකට වැඩි කාලයක් තිස්සේ බාර නොගෙන ඉඳලා පාර්ලිමේන්තුවට ආව තනි අලියව රජ කරවන්න රාජපක්ෂලා කටයුතු කළා. 69 ලක්ෂයක් ගෝඨාභයට ඡන්දය දුන්නේ මහබැංකු හොරාව අල්ලන්න මිසක් හොරාව රජ පුටුවේ ඉඳන්න නෙමෙයි! ඒත්, වුණොත් ඒ දේමයි. පාර්ලිමේන්තුව ඇතුළෙ කරන සුපුරුදු වෙන්දේසිය තියලා මන්ත්‍රීවරු එහෙට මෙහෙට විකුණුනා. අන්තිමේට, හරි පැහැදිලිව ඉරක් ගහලා වෙන්කරා වගේ ජනතාවාදී කණ්ඩායම නියෝජනය කරමින් ජාතික ජන බලවේගයත්, ජඩ දේශපාලනය තවදුරටත් කරපින්නා ගත් ගජමිතුරු දේශපාලන සන්ධානය ලෙස සමගි ජන බලවේගය, පොහොට්ටුව හා එක්සත් ජාතික පක්ෂයත් එක්වුණා.

ඒ කොයිහැටි වෙතත් මේ කාලේ කියන්නේ අපි හොඳින්ම අපේ ඇස්, කන් ඇරගෙන ඉන්න ඕන කාලයකුයි. උදේට පත්තරේ විස්තරේ බලලා නම් ඔබ දේශපාලනය කියවගන්නෙ, ඔබ ඉතා දරුණු ලෙස රැවටීමකට ලක් වී තිබෙනවා. එනිසා ඉතාම ප්‍රවේශමෙන්, ප්‍රවෘත්තිය කියවීමට පෙර එය ඉදිරිපත් කරන මාධ්‍ය ආයතනයේ දේශපාලන භාවිතාව කියවගත යුතුයි. මොකද දැන් මොනව කිව්වත්, නයි ධාතු පෙන්නලා, දේශපාලන සංවාදවල, ප්‍රවෘත්තිවල, පත්තර විස්තරවල රෙදි අපුල්ලලා අපුල්ලලා, ඔය මාධ්‍ය මහත්වරු ලොකු වැඩ කොටසක් කළා අර උපාලි හාමුදුරුවෝ ඉල්ලපු ජාතියේ හිට්ලර්ලා, අමන පාලකයෝ පත් කරවන්න. ඒ නිසා ඒ අයටත් මේ වරදින් ගැලවෙන්න ටිකක් අමාරුයි.

ඒ නිසයි අපි කියන්නේ මේ රටේ මහජනතාවට මේ සියලු දෙයින්ම, සියලු දෙනාගෙන්ම ප්‍රවේශම් විය යුතු බව. අපි ප්‍රජාතන්ත්‍රවාදය රකින තරමටම, අපිට අප වෙනුවෙන් කතා කිරීමට අයිතියක් තිබෙනවා. පාලකයෝ උත්සහ කරනවා ඔවුන් මෙන්ම අපගේත් ප්‍රජාතන්ත්‍රවාදී රාමුව කඩන තැනට අපිව තල්ලු කරන්න. නමුත් අපට අවශ්‍ය වන්නේ තවදුරටත් අපේ රටත්, ජනතාවත් පීඩාවට පත්වීමට ඉඩහැරීම නොවෙයි! අපට අවශ්‍ය ප්‍රජාතන්ත්‍රවාදී, සාධාරණ හා ඉක්මන් මහමැතිවරණයක්! එමගින් පමණයි මේ විකෘති ජනමතයක් සහිත පාර්ලිමේන්තුව වෙනුවට මේ මොහොතේ සැබෑ ජනමතය නියෝජනය කරන පාර්ලිමේන්තුවක් හා ජනතාවාදී පාලනයක් වෙනුවෙන් වහාම මැදිහත් වීමට හැකි වන්නේ. ඒ නිසා ඒ වෙනුවෙන් එක්වෙමු! සටන් කරමු!!

නමුත් අප සටන් කළ පමණින්ම දිනන්නේ නැති බවද සිහි තබා ගනිමු. අප දිනන්නේ, සැබෑ ජනතාවාදී පාලනයක් ගොඩනැගී දාටයි. ඒ දිනය උදාවන්නේ මේ 74 අවුරුදු දේශපාලනයට තිත තබා නව දේශපාලන සංස්කෘතියක් මේ බිමේ පැළකළ දාටයි. එනිසා එතෙක් අපි සටන් කරමු! සටනින් තොර ජයක් නොමැති සේම, ඒ සඳහා ශක්තිමත් හා නිවැරදි සංවිධානයක නායකත්වයක්ද අත්‍යවශ්‍ය බව සිහියේ තබා ගනිමු. අධිපති මතවාදයන් හා එවැනි මතවාද නිර්මාණය කරන්නන් විසින් විවිධ මඩ අවලාද එකපිට එක දමා ගැසුවද ජාතික ජන බලවේගය ප්‍රමුඛ දේශපාලන ප්‍රවාහය විසින් දිනෙන් දිනම මේ මහපොළොව ඉල්ලා සිටින ජනතාවාදී වෙනසක් වෙනුවෙන් සිය යුතුකම් කොටස ඉටු කරමින් සිටී. එහෙත් කෙතරම් විෂය මූලයන් සැපිරුවද, ජනතාව මේ වෙනසට සූදානම් නැතිනම් කිසිසේත්ම ජනතාවාදී පාලනයක් ඇතිවීම උදෙසා රනිල්ලාගේ පන්තිය ඉඩ තබන්නේද නැහැ. මේ හදිසි නීතිය එන්නෙත් ඒ සඳහායි. ඒ නිසා හිතෙන හිතෙන ක්‍රමවලට, තනි තනිව සටන් කරනවා වෙනුවට, වඩා නිවැරදිව උපක්‍රම තෝරමින්, ශක්තිමත් නායකත්වයක් යටතේ සටන්කොට අරගලය තුළින් සැබෑ ජනතාවාදී ජයග්‍රහණයක් දිනීමට එකාමෙන් පෙරට එමු! මව්බිමට ජය වේවා! ජනතාවට ජය වේවා!!

# “මේක දියුණු සමාජයක ලක්ෂණ එකතුකරගත් අරගලයක්!”

සමාජවාදී තරුණ සංගමයේ ජාතික කමිටු සාමාජික
**සංජය විශ්වනාත්**



### තරුණ අපිට අලුත් අත්දැකීමක්

තරුණ දේශපාලන ව්‍යාපාරයක් ලෙසත්, පක්ෂයත් ලෙසත් අපි විවිධාකාරයේ අරගල කරල තියෙනවා.ඒත් පොදු ජනතා නැගිටීමක් ලෙස මේ අරගලය අපිට අලුත් අත්දැකීමක්.. ලෝක ඉතිහාසයේ වගේම ලංකා ඉතිහාසය තුළත් මෙවැනි අත්දැකීම් තිබුණත් තරුණ පරම්පරාවෙ අපිට ලැබුණ පළවෙනි අත්දැකීම..

මේක ඉබේ පැනනැගුණ එකක් නෙවෙයි, ඒකට අවශ්‍ය ආර්ථික, දේශපාලනික හා සමාජයීය වශයෙන් ජනතාවට දරාගත නොහැකි කඩාවැටීමක් රටේ තිබුණා. මේ දූෂිත පාලකයින් හෙළිදරව් කිරීමත් එයට විරුද්ධව ජනතාව නැගීසිටිය යුතුය යන්නත් ඒ නැගීසිටින්නෙ කොයිවිදියටද යන්න ගැනත් අපි පාර්ලිමේන්තුව හා ඉන් පිටතදීත් ජනතාව දැනුවත් කරමින් සිටියා. පාරෙදි, වැඩපලවල්වලදී, සමාජමාධ්‍ය ඇතුලු හැකි හැම විදියකින්ම අපි ජනතාව දැනුවත් කරා..ඒකේ ගුණාත්මක පියවරක් විදියට සමාජවාදී තරුණ සංගමේ අපි මාර්තු 18 වෙනිදා ජනාධිපතිට ධූරයෙන් ඉවත්වීමට බලකරමින් දැවැන්ත පාගමනක් එක්ක ඇවිත් ජනාධිපති ලේකම් කාර්යාලය වැටලුවා. මේ ගෝල්ෆේස් සටන අලුත් අත්දැකීමක් උනත්, ඒ සටන ඇරඹීමට අවශ්‍ය අඩිතාලම දාන්න තරුණ ව්‍යාපාරයක් විදියට අපි සක්‍රීයව මැදිහත්වුනා...

### විවිධ කණ්ඩායම්වල එකමුතුවක්

ගෝල්ෆේස් සටන පටන් ගත්ත දවසෙ ඉඳන් අදවනතුරු අපි මේ පොදුජන අරගලයට අපේ දායකත්වය ලබාදෙන්න ඕන කියන අවංක චේතනාවෙන් යුතුව සම්බන්ධ වෙලා ඉන්නවා.. එහෙම එකතුවෙද්දි අපි දැනගත්තා ගෝඨාභය රාජපක්ෂ එලවීමේ අරමුණෙන් අවංකව එකතුවුණ තනි තනි පුද්ගලයන්, සිවිල් සංවිධාන, සෘජු හා වක්‍ර ලෙස දේශපාලන කණ්ඩායම්වලට සම්බන්ධ සංවිධාන වගෙ විවිධ කණ්ඩායම් මෙයට සම්බන්ධවෙලා ඉන්නව කියල..

දවසින් දවස ගෝල්ෆෙස් අරගලයට පොදුජනතාව සහභාගි වන ප්‍රමාණය වැඩි උනා. එතනදි තිබුණ ප්‍රශ්නයක් තමයි කොහොමද මේතරම් ප්‍රමාණයකට කෑම, වතුර, සනීපාරක්ෂක කටයුතු සිද්ධකෙරෙන්නෙ කියන එක. සුවිශේෂීම දෙය තමයි මේ අරගලයට ආශිර්වාද කරන බොහෝ පිරිසක් ඒ අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා ගෝල්ෆෙස් අරගලයට අවශ්‍ය පහසුකම් සැපයුවා. පූර්ණකාලිකයෙක් ලෙස පෞද්ගලිකවත්, දේශපාලන ව්‍යාපාරයක් විදියටත්, පොදු අරමුණක් වෙනුවෙන් කැපවෙද්දි ඒ සඳහා ඇතිහැකි අයගෙන් උපකාර ලැබීම පිළිබඳව අත්දැකීම් මීට පෙර සිට අත්දැකීම් තිබුණත්, මෙහි තියෙන සුබවාදී අත්දැකීම තමා ගෝල්ෆේස් අරගලයටත් ඒ විදියට මහජනතාව අතරින් උදව් ගලා එන්න පටන් ගත්ත එක. පාවිච්චි කළ,බාලදක්ෂ මාවතේ ඉදිකළ ජංගම වැසිකිළිවල ඉඳන්ම, කෑම, වතුර පවා මේ රටේ ව්‍යාපාරිකයෝ, සාමාන්‍ය ජනතාව ගෝල්ෆෙස් අරගලයට ලබාදීපු ඒවා.

### වචනයේ පරිසමාප්තයෙන්ම ‘ශ්‍රී ලාංකිකයින්ගේ’ අරගලයක්!

ලංකාව පුරා ඉන්න මිනිස්සු මේ අරගලයට සම්බන්ධ උනා. ගෝල්ෆේස් බිමට ආවා. ඒ කොහෙදිවත්, කිසි අවස්ථාවකදි අපට ඇහුණෙ නෑ ජාතියක් හෝ වෙනත් කවරාකාරයේ හෝ වෙනස්කමක් නිසා කෙනෙක්ට සිදුවුණ කරදරයක් කරපු සිද්ධියක්. සිංහල,දෙමල,මුස්ලිම්, විශේෂයෙන් මුස්ලිම් කාන්තාවො, තරුණියන් දිවා රෑ නොබලා මේ අරගල බිමේ රැඳුණා, අපිත් සමඟ සටන්පාඨ කිව්වා.. ඒ හැමෝම ජාති ආගම් බේදයකින් තොරව, සැකයකින් තොරව අරගලයට සම්බන්ධ උනා. ඒක අපි ලබපු සුවිශේෂීම අත්දැකීමක් වගේම ජයග්‍රහණයක්. ඒකෙන් ඔප්පු උනා ජාතිවාදයේ සැබෑ උවමනාව තියෙන්නෙ පාලකයින්ට මිසක් සාමාන්‍ය ජනතාවට නෙවෙයි කියන එක.

ඒ වගේම මේ අරගලයට කාන්තා-පිරිමි භේදයක් තිබුණෙ නෑ.. සාමාන්‍ය සමාජය තුළ අඩු පිළිගැනීමට ලක්වෙන LGBT ප්‍රජාව පවා අරගලයේ සක්‍රීය කොටස්කරුවන් ලෙස දායකවීම සුවිශේෂී අත්දැකීමක් උනා...

### ඔව්, මේක ස්මාර්ට් පැකේජ් එකක්

වීදියේ සටනට පමණක් සීමා නොවී, ගෝල්ෆෙස් අරගලය ඇතුළේ අධ්‍යාපනික, දේශපාලනික, රසවින්ඳන වැඩසටහන්, ආර්ථික කතිකාවත් සිදුකළා. පුස්තකාලයක් පවා නඩත්තුකරගෙන ගියා. ඒක සැබෑ මහජන පුස්තකාලයක්. සාමාන්‍ය පුස්තකාල වගේ අගුලු දාලාතියෙන එකක් නෙවේ, ඒක හැමෝටම විවෘතයි. පොත් තියෙන අය පොත් ගෙනත් දුන්නා. කියවන්න කැමති අය පොත් අරන් කියෙව්වා. අරන් යනවා. කියවා අවසන් වුණාම ළඟම ඇති මහජන පුස්තකාලයට හෝ පොත් නැවත භාරදෙන්න ක්‍රමවේදයක් තිබුණා. ඒ වගේමයි ගෝල්ෆෙස් බිමේ Tear gas සිනමා ශාලාව. එහිදී චිත්‍රපටි, කෙටිචිත්‍රපටි නරඹනවා, විචාර කළා, වගේම අලුත් සිනමා, ගීත නිර්මාණත් එළිදැක්කුවා. අනිත් වටිනාම අත්දැකීමක් තමයි මේ අරගලය පරිසරය සම්බන්ධයෙන් විශේෂ හැඟීමක් සහිතව කළ අරගලයක්..දහසක් එකතු උනත් පහුවදා උදේ වෙද්දිත් ගෝල්ෆේස් බිම, බීච් එක කිසිදෙයක් සිදු නොවූ තරමට පිරිසිදුව තියාගන්න මේ අරගලයට පුලුවන් උනා.

### මිනිසුන් හා අරගලය ගැන ආශ්වාදයක් ගෙනදුන් දවසක්

මේ අරගලයේදී ලබපු ආශ්වාදජනකම අත්දැකීම ලැබුණේ මහින්ද රාජපක්ෂගේ මැරයන් පහර දුන්න දවසේදී. සාමාන්‍ය මිනිස්සු තුළ අරගලය පිළිබඳව කෙතරම් විශ්වාසයක් තිබ්බාද කියන එක ඔප්පු වුන දවසක්. තමන්ට එල්ලවෙලා තියෙන පීඩනයට එරෙහිව, මේ ධනවාදී පාලකයන්ට එරෙහිව පෙරමුණ අරගෙන ඉන්න තරුණ තරුණියන්ව, ඔවුන් ගෙන යන අරගලය රැකගන්න ඕන කියලා විනාඩි 10-15ක් වගේ කෙටි කාලයක් ඇතුළතදී ගෝල්ෆේස් පිටිය එකම හිස් ගොඩක් වෙච්ච දවසක්. තරාතිරම් නොබලා තමන්ගේ කාර්යාලවලින් වැඩපලවල්වලින් එළියට බැහැපු, ඉදිකිරීම් කරමින් සිටි කම්කරුවන්, වරාය සේවකයන්, රෝහල්වල හෙදියන්, වෛද්‍යවරුන් එළියට බැහැපු දවසක්. ගෙවල්වල හිටපු සාමාන්‍ය ජනතාව ඇඳිවතෙන් පාරට බැහැපු දවසක්. මිනිස්සු ගැන වගේම මේ සටන ගැනත් ඉතා ආශ්වාදයක් ගෙන ආව දවසක්, අත්දැකීමක් එදා ලැබුණා..

### සුබ- අසුබ සමඟ පෙරට!

සටනක් කරද්දි සුබවාදී වගේම අසුබවාදී අත්දැකීමුත් තියනවා. විවිධ මත දරන අය වගේම මේ ධනවාදි පාලකයන්ගේ කුමන්ත්‍රණකරුවන්, ව්‍යාපාරික අරමුණුවලින්, තමන්ගේ පුද්ගලික අභිලාෂයන් වෙනුවෙන් අරගලයට ආපු අය, ආණ්ඩුවේ ඔත්තුකරුවන්, මේ අරගලය පුරාවට දකින්න ලැබුණා. අරගලය ආපස්සට අදින්න මේ අය ක්‍රියාත්මක වුණා. ඒ නිසා මේ හැමදේකටම එරෙහිව සටන් කරන්න, ඒ අවස්ථාවන් නිවැරදිව හෙළිදරව් කරගන්න, ඒ කණ්ඩායම් හරියට කළමනාකරණය කරගනිමින් ගොල්ෆේස් අරගලය ජයග්‍රහණයෙන් කෙළවර කිරීම දක්වා යන ගමනේදී තරුණ දේශපාලනව්‍යාපාරයක් විදියට අපි අපේ උපරිම දායකත්වය ලබාදුන්නා.



# යුග දෙකක පවන!!....

පණ ගැහෙන රටක, ශේෂ වූ හුස්මපොද රකින්නට අද රටම ඇහැරී ඇත. මේ, 74 වසරක් මෙරට වසාගත් දූෂිත, ධනවාදී පාලන අඳුරට එදිරිව ඉතිහාසයේ කවරදාකටත් වඩා, සකලවිධ ශ්‍රී ලාංකිකයන් හඬ නගන මොහොතක්ය. බුදුන්, ජේසුන්, නබිතුමන් අද එකම අහසක වැඩ ඇත. ඒ අහස යට සිහල, දමිල, මුසල්මානුවන් එකම අරමුණක් අභියසය. ශිෂ්‍යයින්, ගුරුවරුන් මෙන්ම සියලු වෘත්තිකයන්ද, කිරිසප්පයින් වඩාගත් ගැහැණු-පිරිමි, තරුණ, වැඩිහිටි සියල්ලෝමද අද වඩා යහපත් හෙටක් උදාකරග ැනීම වෙනුවෙන් එකම සටනකය. වීරියෙන් සුපෝෂිත සටන්පාඨවල සිට විද්‍යාව, තාක්ෂණය මෙන්ම රංගනය, කවිය, ගීතය ඇතුලු සකලවිධ කලාවන්ද අද ඒ සටන් බිමට අවිය වෙමින් සිටී.

දඩබිමේ..
රතු කඳුලු මල් පිපේ...
පරපුරේ විරු යශෝ අතරින්
නික්ම යන මගෙ පුතේ..
රුදුරු රකුසන් සෙවණැලි ඇහැරී
තවම නර බිලි යදී.......
නුඹයි පෙරමුණ ගමනට යන්නේ
මගෙ පුතා ණය නැතී.......

ඒ ශ්‍රී ලාංකීය සංගීතයේ අමරණීය හඬ- නන්දා මාලිනිය නූතන අරගල බිමට බට තරුණ තරුණියන් වෙනුවෙන් කළ ආදරණීය ආමන්ත්‍රණයයි. බුද්ධික සේමසිංහයන්ගේ පද රචනයෙන්, තිළිණ රුහුණගේගේ සංගීතයෙන් උපන් 'දඩබිම' නම් වූ එම ගීය සමඟ දැනුනේ හුරුපුරුදු බවකි.. ඒ ගීය හද හරහා හමා ගියේ අතීතයටය. ඔව් ඒ අතීතයේ "පවන"යි. වර්ෂ 1987 දී, එනම් මීට වසර 35කට පෙර තහනමට ලක්වූ පවන නම් වූ ගී සංග්‍රහයේ මතකයයි. අදට වඩා ලෝකය, ලෝකයාට විවෘත නොවූ අවධියක, එහෙත් මෙවන්වූම රට මුහුණ පෑ අසීරු අවස්ථාවකදී, එකල පාලකයින්ට විරුද්ධව නැගී සිටි මෙවන්වූම දහස්ගණන් තරුණ තරුණියන්ගේ අරගලයට නන්දා මාලිනිය එදා ඇගේ ස්වරයෙන් සුබ පැතුවේ සුනිල් ආරියරත්නගේ පද කැටිවූ "පවන" ගී සංග්‍රහය හරහායි.

රණ දෙරණේ ගිනි අවුගත් යුධ සෙබලනි අසනු මැනව
වෙඩි උණ්ඩය වැයකොට නුඹ සුරැකිය යුතු ජන පිරිසය!
යුක්තිය උදෙසා මොරදෙන ජනයා නසතොත් වියරුව
වැනසෙන්නේ නුඹද අයත් පංතිය බව සිතට ගනුව!!

අද, ඇවිලෙන කුසගිනි වෙනුවෙන් පාරට බැසීමේ වරදට රඹුක්කනදී තරුණයෙකු ඝාතනය කිරීමට තරම් වූ මේ පාලකයින්ගේ නරුම බව අපි අපේ දෑස්පනාපිටම අත්විඳිමින් සිටින්නෙමු. එසේනම් එදාද තරුණ තරුණියන් දසදහස් ගණනක පපු කැවුතු ගිණි බටවලින් සිදුරු කර දමන්නට පාලකයින් සහ ඔවුන්ව සුරකින සෙබළුන් නොපැකිලෙන්නට ඇත. යහපත් රටක් වෙනුවෙන් කළ අරගල දෙකක කාලයන් හා හැඩයන් වෙනස්වූ නමුත් එදාද පාලකයින් හැසිරෙන්නට ඇත්තේ අද මෙන්ම වියරුවෙනි. නන්දා මාලිනිය මෙසේ ගයන්නට ඇත්තේ ඈ අත්දුටු ඒ වේදනාවය.

යදමින් බැඳ විලංගුලා - මගේ පුතා රැගෙන යන්
ඉදිකටු ඇණ ඇඟිලි තලා - දෙතිස්වදය පමුණුවන්
අළුත් ලොවක් ගැන සිතීම - දඬුවම් දෙන වරද නම්
කුමට එරට අධිකරණය - නීතිය සහ විනිසුරන්.

කකා බිබී නටන අතර - නරුම යහළු යෙහෙළියන්
පන්දු කෙළින අතර ඉහල - පාසල්වල අමනයන්
රට ගිණි ගෙන ඇති වග දුටු - මගේ එකම පුතණුවන්
එගිණි නිවන මග සෙවීම - වරදක් දැයි මට කියන්...

එදා උපන්බිම වෙනුවෙන් නැගීසිටීමේ වරදට දසදහස් ගණනක් තරුණ තරුණියන් හිස්,මස්,ලේ පිදූවද, මරණයට එහා ගිය වේදනාවන් විඳිමින් දඬුවම් ලැබූවද, එකල පාලකයෝ ඒ උත්තරීතර මිනිසුන් හා ඔවුන්ගේ මරණයන් පවා වරදකරුවන් ලෙස ඉතිහාසයේ ලියූහ. යුක්තිය වෙනුවෙන් හඬලෑ එකල පරපුර මරණයෙන් පසුවද දශක ගණනාවක් දඬුවම් ලැබූයේ එලෙසය. නමුත් ඒ කිසිවකින් ඔවුන්ගේ අභිප්‍රාය මරාදමන්නට හෝ සත්‍යය වළලන්නට කිසිවෙකුට හෝ නොහැකිවිය.

ගිනිගන්නා රටක කෙළින - මී හරකුන් වැනි පුතුන්
කුමටද මට මහ විරුවෙකි - සිරගෙයි මළ මගෙ පුතුන්
කෝටිගණන් බිහිවේවා - මගෙ පුතු වැනි තව පුතුන්
කිරිමව් ලෙස මම ඉන්නම් - එවන් පුතුන් ළඟ උතුම්...

නන්දාට කිරිමව් වන්නට ඒ පුතුන්ගේ පරපුර හා ඔවුන්ගේ අභිප්‍රායන් නැවත ඉපදී ඇත... ඇගේ ප්‍රාර්ථනය අද ඉටුවී ඇත.. එදා මියගිය පුතුන් වැනි තව පුතුන් ලක්ෂ ගණනින් බිහිව ඇත.. දශක තුනක අවෑමෙන් වුවද ඒ මිහිදන් වූ සත්‍යය ගසක් මෙන් වැඩී දලුලා වඩාත් ශක්තිමත් ලෙස අද මල් පූදා ඇත.. වඩා දියුණු කාලයක, වඩා දියුණු හැඩවලින් නැවත පණ ලද ඒ අභිප්‍රායයන් හෙට එල දරනු නිසැකය.

බන්ඳා පංචායුධ බැමී
කැන්ඳා සරසවි මියුලැසී
සංග්‍රාමය මැද ණය නැතී
නින්දා නැති සුව නින්දකී.......

සැමට යහපත් අනාගතයක් වෙනුවෙන් මව්බිමට වූ අපරිමිත ස්නේහයෙන් දිවි කුසුම් පුදදුන් ආදරණීය සොයුරු සොයුරියනේ, ඉතින් දැන් සුවසේ නිදන්න. වර්තමානය ඔබව නිදොස්කොට නිදහස් කර ඇත!!

FORWARD
සමාජවාදී තරුණ සංගමයේ මධ්‍යම පුවත්පත
464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
Tel: 0112076198
Email: syuforwardnews@gmail.com
syulanka@gmail.com
fb:syulanka
web:syusrilanka.com

## වැඩේ තාම ඉවර නෑ!.

සමාජයේ කියමනක් තියෙනවා කැහි ගෑණි දීලා හොටු ගෑණි ගත්තා වගේ කියලා. අපේ රටටත් අද වෙලා තියෙන්නේ ඒ වගේ දෙයක්. අප්‍රේල් නමය ගෝල්ෆේස් අරගලය පටන්ගත්තේ ගෝඨාභය රාජපක්ෂ ප්‍රමුඛ රාජපක්ෂ පාලනය විසින් මේ රට අන්ත අසරණතාවයට පත් කිරීමත්, ජීවත්වෙන්න බැරි කළ පසුබිම තුළ, අධික වංචා දූෂණයන්ට එරෙහිවත් මිනිස්සු පාරට බැසීමෙනි. එම සටන මැයි 9, ජූනි 9, ජූලි 9 ලෙස තීව්‍ර වී ඉදිරියට ආවා.

ජනතාව තම පීඩාවට එරෙහිව එක්ව සටන් කළා. නමුත් ඒ සටන කෙළවර වුණේ ප්‍රතිගාමීයෙක්, රාජපක්ෂ ආරක්ෂකයෙක්, රටට ද්‍රෝහීයෙක් ජනාධිපති පුටුවේ වාඩිවෙලා. මේ ජනතා සටන, ජනතා ජයග්‍රහණයක් බවට ගෙන ඒමට තිබූ අවස්ථාව ජනතාවගෙන්ගිලිහී ගියා. ඒ වෙනුවෙන් ප්‍රතිගාමීන්, අවස්ථාවාදීන් තම පටු උවමනාවන් වෙනුවෙන් ජනතා ජයග්‍රහණය ආපස්සට හැරවූ බවක්ද පෙනෙන්නට තිබෙනවා.

එහි ප්‍රතිඵලය වී ඇත්තේ වැඩ බැරි පින් ජනපතියෙක් ලෙස රනිල් වික්‍රමසිංහ පත්වීමයි. රනිල් දන්න රාජ්‍ය පාලනයක් නැත. දන්නා එකම දෙය නම් තමන්ගේ පන්තිය, පරම්පරාව රැකීම පමණයි. ඒ වෙනුවෙන් රනිල් අරගලකරුවන් දඩයම් කිරීමට පටන් ගෙන ඇත. එය විශේෂ අමුත්තක්ද නොවේ!. රාජපක්ෂ පවුලේ සිටම කරගෙන ආ මර්දනය ඒ විදිහටම ඉදිරියට ගෙන යෑමකි.

දැන් අප විසඳුම් සෙවිය යුත්තේ කෙසේද? ඒ කොතැනටද? තවත් හොටු ගෑනියෙක් පත්කර ගැනීමටද? නැත! දැන් අරගලකරුවන් අරගලයට සවිඥානිකව මැදිහත්විය යුතුය. ඒ සඳහා කළ යුත්තේ රනිල් වැනි ජනතාව ප්‍රතික්ෂේප කළ පාලකයෙකු පත් කළමේ විකෘති ජනමතයක් සහිත පාර්ලිමේන්තුව විසුරුවා හැරීමය. එසේ නොමැති වුවහොත් නැවත වතාවක් රනිල් පැන්වීමෙන් බලයට පත්වන්නේ තවත් එවැනිම පන්නයේ 'රාජපක්ෂ ආරක්ෂකයකු' පමණි. දැන් රටට අවශ්‍යව ඇත්තේ අලුත් ජනමතයක් විමසා බැලීමය. එම මැතිවරණයේ ජයග්‍රහණ මොන විදිහට ඒ දැයි පූර්ව නිගමනයක සිට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමට විරුද්ධ වීම ජනතා අභිලාෂයන් ආපස්සට ඇද දැමීමකි. එනිසා මේ පවතින අර්බුදයට කඩිනමින් ගෙන ආ හැකි විසඳුම වන්නේ අලුත් ජනමතයට සරිලන ව්‍යවස්ථාදායකයක් නිර්මාණය කිරීම පමණි. නැවත වතාවක් ජනතා අරගලය අවස්ථාවාදීන්ගේ ග්‍රහණයට නතු නොවී ඉදිරියට ගෙන යා හැක්කේ එලෙසය.

# ආර්ථිකය මරණයක්!



අපේ රටේ ආර්ථිකය අද ඇත්තේ තෙල් පෝලිමක නතර කළ පැරණි ලොරියක සේය. මන්ද තෙල් පෝලිම්, ගෑස් පෝලිම්වලින් නිරූපණය වන්නේ අපේ රටේ ආර්ථිකය වන බැවිනි. යථාර්ථය එයය. අපි මෙම ආර්ථික අර්බුදය මීට පෙර දුටුවෙමු. නමුත් අපේ රටේ අදූරදර්ශී පාලකයින් එය නොදැක්කේය. සැබෑවටම නොදැක්කා මෙන් සිටියේය. යථාර්ථය වසන් කොට අසීමිත ලෙස හොරකම් කළේය. අසීමිත ලෙස ණය ගත්තේය. එම ණය ඵලදායි නොවන ව්‍යාපෘතිවලට යෙදවීය. ණය හා ආනයන මතම රට පවත්වාගෙන යෑම නිසා අපේ රටේ නිෂ්පාදනය කඩාවැටුනේය. අපේ රට අද තිබෙන තත්වයට ඇදවැටීම පාලකයින්ගේ එම අදූරදර්ශි ක්‍රියාවලියේ ප්‍රතිඵලයකි. හිටපු මුදල් ඇමතිවරයාට අනුව විදෙස් සංචිතවල වටිනාකම බිංදුවකි. විදෙස් සංචිත හිස් වූ විට ආනයන මත යැපෙන, ණය උගුලක හිර වූ රටක ආර්ථිකය කබලෙන් ලිපට වැටීම අරුමයක් නොවේ!

ඛනිජ තෙල් අද රටේ ආර්ථිකයේ ප්‍රධාන තීරකයෙක් බවට පත් වී ඇත. ස්වභාවිකව ඛනිජ තෙල් නොපිහිටන නිසා අප රටට ඛනිජ තෙල් ආනයනය කළ යුතුය. රටේ අවම දෛනික ඉන්ධන අවශ්‍යතාව ඩීසල් මෙට්‍රික් ටොන් 6000 ක් හා පෙට්‍රල් මෙට්‍රික් ටොන් 3500 කි. නමුත් මෙම දෛනික තෙල් අවශ්‍යතාව සම්පූර්ණ කිරීමට අද අපේ රටේ ආර්ථිකයට නොහැකි වී ඇත. බොරතෙල් සහිත නෞකාවක් වරායේ නැංගුරම්ලා බලා සිටින්නේ මුදල් ගෙවන තුරුය. ඛනිජ තෙල් ආනයනය සඳහා ඩොලර් නොමැතිවීමත් සමඟ ඛනිජ තෙල් ආශ්‍රිත නිශ්පාදන හා සේවාවන් සියල්ල අකර්මණ්‍ය වී ඇත. නිෂ්පාදන ආර්ථිකයක් නැති, ආනයන මත යැපෙන අපේ රටේ සියලු පන්නයේ ආනයනද මේ වන විට අකර්මණ්‍ය වී ඇත. තත්වය කෙතරම් දරුණු වී ඇතිද යත්, තෙල් නැව එන දිනය තෙක් රට වසා දැමීමට සිදුව ඇත.

සාමාන්‍යයෙන් සපුගස්කන්ද තෙල් පිරිපහදුවෙන් දිනකට පෙට්‍රල් මෙට්‍රික් ටොන් 350ක්, ඩීසල් මෙට්‍රික් ටොන් 750ක්, දැව්තෙල් මෙට්‍රික් ටොන් 1300ක් හා භූමිතෙල් මෙට්‍රික් ටොන් 550ක් පමණ පිරිපහදු කෙරේ. නමුත් සපුගස්කන්ද තෙල් පිරිපහදුව බොරතෙල් නොමැතිවීමෙන් මාස හතක පමණ කාලයක් ඇතුලත වසා දමන ලද සිව්වැනි අවස්ථාව මෙය වේ. අපේ රටේ තෙල් බෙදාහැරීමේ ඒකාධිකාරය විදෙස් සමාගම් වෙත පැවරීමට කැබිනට් මණ්ඩලය තීරණය කර ඇත්තේ මේ අතරතුරය. මෙම තීරණය අපේ රටේ 'සමස්ත ආර්ථිකය තීරණය කිරීමේ අයිතිය' වෙනත් රටකට පවරනවාක් මෙනි. නමුත් රටේ ආර්ථිකය වැටී ඇති අගාධයෙන් ගොඩගැනීමට මෙම අදූරදර්ශී ධනේශ්වර පාලකයන්ට ඇති ළඟම සහ එකම පිළිතුර එය පමණි.

එපමණක් නොවේ! ඩොලර් අර්බුදය මත ගොඩනැගුණු මෙම තෙල් අර්බුදය නිසා ජාතික විදුලි අවශ්‍යතාවයෙන් 10% ක් සපයන නොරොච්චෝල බලාගාරයද වසා දැමීමට සිදුවෙනු ඇත. මේ නිසා ඉදිරියේදී ජනතාවට මීටත් වඩා අඳුරේ සිටීමට සිදුවනු ඇත.

මේ වනවිට ලොව වැඩිම උද්ධමනයක් සහිත රටවල් අතර ලංකාව පසුවන්නේ දෙවන ස්ථානයේය. පලමු ස්ථානයේ සිටින්නේ සිම්බාබ්වේය. මෙය ලංකා ඉතිහාසයේ වේගවත්ම උද්ධමන වාර්තාවයි. එය 132%කි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2022 ජූනි මාසයේ පැවති 54.6%හි සිට 2022 ජූලි මාසයේදී 60.8%ක් දක්වා ඉහළ ගියේය. ඒ අනුව, ආහාර කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ජූනි මාසයේ පැවති 80.1%හි සිට 2022 ජූලි මාසයේ දී 90.9% දක්වා ඉහළ ගිය අතර, ආහාර නොවන කාණ්ඩයෙහි වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය 2022 ජූනි මාසයේ පැවති 42.4% හි සිට 2022 ජූලි මාසයේදී 46.5% දක්වා ඉහළ ගියේය. මෙලෙස අධික ලෙස භාණ්ඩවල මිල ඉහළයාමත් සමඟ බහාලුම් ප්‍රවාහන ගාස්තුද 10% කින් ඉහල දැමීමට බහාලුම් ප්‍රවාහන හිමියෝ තීරණය කළහ. මෙය භාණ්ඩ මිල නැවත නැවතත් ඉහලයාමට තදින්ම බලපායි. මේ අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහල යාම, අධික ජීවන වියදම නිසා ජනතාව ණය ලබාගැනීම වේගවත් කර ඇත. එය 2021 මුල් කාර්තුවට සාපේක්ෂව 58%ක ඉහලයාමක් ලෙස වාර්තා වේ.

පවතින උග්‍ර ඩොලර් හිඟය අපේ රටේ අපනයන ආර්ථිකය කඩාවැටීමටද තදින් බලපා ඇත. ඩොලර් හිඟය හේතුවෙන් අමුද්‍රව්‍ය නොමැති වීම නිසා කර්මාන්ත ශාලා හා ඉදිකිරීම් ආයතන පවත්වාගෙන යාමට නොහැකි තත්වයේ අවදානමකට ලක් වී ඇත. ඇඟලුම්, විදුලි උපකරණ නිෂ්පාදන, කුළුබඩු ආශ්‍රිත නිෂ්පාදන, බේකරි ඇතුළු කර්මාන්ත ගණනාවක් මේ වනවිට වැසී යාමේ අවදානමකට ලක්ව තිබේ. මෙම කර්මාන්ත තුලින් දළ දේශීය නිෂ්පාදිතයට 51%ක් පංගුවක් එකතු කරයි. ඉන් 20%ක් පමණ ඇගලුම් ක්ෂේත්‍රයෙන් සැපයෙන අතර බිලියන 1000කට අධික මුදලක් ඉන් ආර්ථිකයට සැපයේ.


මෙම තත්වය තුළ ඇඟළුම් කර්මාන්තය බිඳවැටුණහොත්, එහි සෘජු රැකියාවල නිරත ශ්‍රමිකයින් 350,000කට සහ වක්‍ර රැකියාවල නිරත සැපයුම් ක්ෂේත්‍රයේ මිලියනයකට අධික පිරිසකට ආදායම් අහිමිවීමේ අවදානමක් මතුව ඇත. මෙසේ ඇගලුම් ක්ෂේත්‍රයට අමතරව අනිත් ක්ෂේත්‍රවලද විශාල ලෙස රැකියා අහිමිවීමක් සිදුවනු ඇත.

එසේම ඩොලර් ආදායම් රටට එකතුකළ තේ කර්මාන්තයද විශාල කඩාවැටීමකට ලක්ව ඇත. 2021 ජනවාරි සිට අප්‍රේල් දක්වා මුල් මාස හතර තුළ තේ අපනයන ආදායම ඩොලර් මිලියක 417.4ක් වී තිබූ අතර එය මෙම වර්ෂයේ එය ඩොලර් මිලියන 367.2ක් දක්වා පහත වැටී ඇත. එය පසුගිය වසරට වඩා ඩොලර් මිලියන 50.2ක බිඳවැටීමක්ය. මෙරට තේ නිෂ්පාදනය පසුගිය වසරේ මුල් මාස හතරේදී කිලෝග්‍රෑම් මිලියන 104.5ක් වී තිබූ අතර මෙම වසරේදී අදාල කාලය තුළ එය කිලෝග්‍රෑම් මිලියන 85.9 දක්වා පහත වැටී ඇත. මාස 04ක් තුළදී කිලෝග්‍රෑම් මිලියන 18.6ක් හෙවත් කිලෝග්‍රෑම් එක්කෝටි අසූ හයලක්ෂයකින් ( 18,600,000 නට) බිඳවැටීමක්ය.

එසේම විදේශ රැකියා නියුක්තිකයන් පසුගිය වසරේ මුල් මාස 04 තුළ ඩොලර් මිලියන 2,886ක් එවා තිබූ අතර මෙම වසරේදී එය ඩොලර් මිලියන 1,031ක් දක්වා 56.8%කින් බිඳවැටී තිබේ.

මේ අනුව එක් පසෙකින් රටට ඩොලර් එන මාර්ග සියල්ල වේගයෙන් අඩපණ වන අතර අනෙක් පසින් එය අර්බුදයන් නිර්මාණය කරමින්, ඒ සියලු බර ජනතාව මත පැටවෙමින් ඇත. මෙම තත්වය පාලනය කරගැනීමට අසමත් පාලකයින් රට උගස් තියමින් තම බලය රැකගැනීම වෙනුවෙන්ම කටයුතු කරමින් ඇත.

# Robot nurse - ඊජිප්තුවේ රොබෝ හෙදිය



ඊජිප්තුව කිව්වම අපිට එකපාරම මතක් වෙන්නේ පිරමීඩ. ඒත් අද මේ කියන්න යන්නේ ඊජිප්තුවේ රෝහල් සඳහා නිපදවා ඇති හෙදියක් ගැන. ඇයගේ නම ශැමීස්. ඉතින් ඔවුන් පවසන ආකාරයට මෙම රොබෝ හෙදිය ෆාමසියෙන් රෝගීන්ගේ කාමරයට බෙහෙත් රැගෙන යාම, රෝගීන්ගේ කාමරයේ සිට රසායනාගාරයට සාම්පල ලබා ගැනීම, රෝගීන් සහ වෛද්‍යවරුන් අතර වීඩියෝ ඇමතුම් ලබා ගැනීම සහ මූලික කොන්දේසි කියවීම වැනි කාර්යයන් කිරීමට සමත්ව තිබෙනවා. ඒ වගේම රොබෝ හෙදියක් වන ශැමීස්ට රෝහලක කොරිඩෝවක් හෝ කාමර විෂබීජහරණය කළ හැකි අතර උෂ්ණත්වය සහ රෝග ලක්ෂණ හරහා රෝගියෙකුගේ මූලික රෝග විනිශ්චය සිදු කිරීමටද හැකියාව ඇත.

# Electronic scanner - පාඩම් මගහැරුනු සිසුන් සඳහා



අපි දන්නවා පාසලේදී භාවිතා වන කලුලෑලිවල සටහන් තැබීමට ඇති ඉඩකඩ ඉතා සීමිත බව. එවිට ඇති විසඳුම වන්නේ සටහන් මැකීම සහ නැවත සටහන් කිරීමයි. සමහරක් සිසුන් සටහන් ලියාගැනීමේදි තරමක් මන්දගාමීයි. ඉතින් ඔවුන් මෙම සටහන් මැකීමේ ක්‍රියාවලියටනම් එතරම් කැමත්තක් නෑ. එනිසා මේ ප්‍රශ්නයට වගේම තවත් බොහෝමයක් ප්‍රශ්නවලට විසඳුමක් ලෙස ජපානයේ සමහර පාසල්වල ඇති කලුලෑලිවලට **electronic scanners** සවි කර තිබෙනවා. එමගින් කලු ලෑල්ල මත ඇති සෑම සටහනක්ම ස්කෑන් කර එතුළ ගබඩා කර ගන්නවා. එම නිසා පාඩම් මගහැරුනු සිසුවකුට වුවද එම දත්ත නැවත භාවිතා කිරීමට හැකියාව ලැබෙනවා.

# CarLock - වාහන ආරක්ෂක



දවසේ ඕනෑම වේලාවක, ඕනෑම ස්ථානයක සිට, ඔබගේ ස්මාර්ට් ජංගම දුරකථනය හරහා ඔබේ මෝටර් රථය දෙස විමසිල්ලෙන් සිටින්න ඔබට අවශ්‍යද? **CarLock** උපකරණයෙන් ඔබට මෙය පහසුවෙන් කර ගන්න පුලුවන්. **CarLock** හරහා (**Android iy iOS** යන දෙකෙහිම තිබේ) ඔබට ඔබේ වාහනය ගෙන යන විට, එන්ජිම පණ ගැන්වූ විට සහ කිසියම් අසාමාන්‍ය කම්පන තිබේද යන්න නිරීක්ෂණය කිරීමට ඉඩ ලබා දෙන අතර ඔබේ මෝටර් රථයේ බැටරිය පිළිබඳ පවා අවබෝධයක් ලබා දිය හැක. ඉතින් කරන්න තියෙන්නේ මෙම උපකරණය ඔබගේ වාහනයට සවි කිරීම පමණයි.

# Flasher - පාපැදිකරුවන් වෙනුවෙන්



මේ කියන්න හදන්නේ පාපැදිකරුවන් මූලික කරගෙන නිර්මාණය වුණ ස්මාර්ට් වගේම විචිත්‍රවත් ලෙස භාවිතා කළ හැකි ආරක්ෂක උපකරණයක් ගැනයි. මෙය නමින් **flasher**. අපි දන්නවා විශේෂයෙන්ම රාත්‍රී කාලයේදී වාහන ගමන් ගන්නා විට පාපැදිකරුවන් දෙස යොමුවන අවධානය අඩු බව. මෙයට හේතු වන්නේ බොහෝ පාපැදිවල ආලෝකය නොමැතිවීම සහ විශේෂයෙන්ම ඉදිරියක ඇති මංසන්ධියකදි ඔවුන්ගේ ඊළඟ ගමන් පථය පිටුපසින් පැමිණෙන වාහනයකට නිශ්චිතව හඳුනාගත නොහැකි වීමයි. මෙයට විසඳුමක් ලෙස තමයි **flasher** උපකරණය භාවිතා වන්නේ. මෙය වැලමිටට උඩින් අත් පටි දෙකක් ලෙස ඔබට පැලැඳිය හැකි අතර එමගින් ඔබ පාපැදිය හරවන දිශාවට වගේම බ්‍රේක් කරන විටදීද ඔබ ඉදිරියට ගමන් කරන විටදීද අදාල වර්ණයන් ගෙන් යුත් **signal** මගින් ඔබේ ආරක්ෂාව තහවුරු කරයි.

# Kingii - ජලයේදී ඔබ අවදානමක් ගන්න ලෑස්තිද?

අපි දන්නවා පිහීනීමට ඉතා දක්ෂ කෙනෙක්ට වුවද පිහිනීම අතරමගදී ශරීරයේ විවිධ අබාධ පැමිණිය හැකි බව. ඉතින් **Kingii** කියන්නේ පිහිනීමට දක්ෂ වගේම පිහිනීම පුරුදු වන කෙනෙක්ට අවශ්‍යම ආරක්ෂක උපකරණක්. මෙය ඔබේ මැණික් කටුවෙහි පැළඳිය හැකියි. හිතන්න ඔබ ගැඹුරු ජලයේදී පිහිනද්දී කුමක් හෝ අපහසුතාවයක් මත පිහිනීම මොහොතකට නතර වුනා කියලා. මෙන්න මේ වගේ වෙලාවකදී තමයි අපිට මෙම උපකරණය වැදගත් වෙන්නේ. ඔබට පාවෙමින් සිටීමට උපකාර අවශ්‍ය නම්, **Lever** එක අදින්න, එවිට ඔබව මතුපිටට ඇද ගන්නා **inflation bag** එකක් මතු වේ. මෙය ඉතාම සරල තාක්ෂණයකින් නිමවූවක් වුවද එහි ඇති වටිනාකම නම් අඩුවක් නැත.




# රැඩිකල් වෙමු!

පුරා වසර 3ක් තිස්සේ අප ශ්‍රී ලාංකික තාරුණ්‍යයට රැඩිකල් වෙමු යැයි අඬ ගැසුවෙමු. නව තාරුණ්‍යය තුළින් යහපත් සාමාජීය සංස්කෘතියක් සැකසීම වෙනුවෙන් විවිධ දෑ සාකච්ඡා කළෙමු. ක්‍රමයට ගසාගෙන යාම වෙනුවට ක්‍රමය වෙනස් කිරීමට උඩුගම් බලා යාමට ආරාධනා කළෙමු. අවසන් වරට රැඩිකල් වෙමු ලියද්දිත් අපේ රටේ තාරුණ්‍යය තිබුණේ නිසල සාගරයක මෙනි. නමුත් හිටි හැටියේ එය චණ්ඩව පෙරට ඇදුනේ අපට හිතාගත නොහැකි ලෙස මාර්තු 30 වැනිදාක රාත්‍රියේය. ඉන්පසු එක පෙළට සටන් හමුවේ පෙරට ඇදුනු තාරුණ්‍යය ඉදිරි ආරක්ෂක වළල්ලක් ලෙස ගෝල්ෆේස් පිටියෙහි කඳවුරු ලෑහ. ඉනික්බිති ගෝඨාගෝගම නිර්මාණය විය. එතුළ මෙතෙක් කල් අප නිර්මාණය විය යුතු යැයි අපේක්ෂිත සමාජයේ නිදර්ශකයක් නිර්මාණය විය. 2019 තාප්පවල චිත්‍ර ඇඳ සිස්ටම් චේන්ජ් කළ හැකි යැයි සිහින දැක්කවුන් 2022 දී ක්‍රම වෙනසක් වෙනුවෙන් දේශපාලනික වෙනස්කම් සිදු විය යුතු යැයි තේරුම් ගත්තෝය. සුලු ජාතීන් එළවීමට ගෝඨා ගෙනා උන් පාලක පංතියට හැර වෙනත් ඕනෑම කෙනෙකුට ආ ගිය හැකි තැනක් නිර්මාණය කළෝය. ජාති, ආගම් කුල-මල ඉවත ලූහ. දැනුමට හැකියාවට පමණක් හිස නැමූහ. ඒ අතර කුමන තරාතිරමක හෝ අරගලයට කලු පැල්ලම් එකතු කරන්නන් ඉවත් කිරීමටද නොපසුබට වූහ. සීමිත සම්පත් තම තමන් පෞද්ගලිකව භුක්ති විඳීම වෙනුවට පොදු අරගලයට ගෙනත් පොදුවේ බෙදා ගත්හ.




මේ වන විට අපි එහි ප්‍රධානතම අරමුණක් ඉෂ්ඨ කරගෙන සිටින්නෙමු. ඒ ගෝඨාභය ගෙදර යැවීමය. මේ සා විශාල පෙරළියක් වූ සමාජය හුදු ඔලුගෙඩි මාරුවකින් විසිරී යා යුතු නැතැයි අපි විශ්වාස කරමු. ඉන් එහා ගිය ක්‍රම වෙනසකට අප මෙම අරගලය දියත් කළ යුතුව ඇත.

එය තවදුරටත් දේශපාලනයෙන් වියුක්තව කළ හැකි කරුණක්ද නොවේ. අරගලය හරහා ඇතැමුන් බොරදියේ මාලුබාන්නට සැරසෙනු දැකිය හැකිය. රාජ්‍යය, ප්‍රජාතන්ත්‍රවාදය, ස්වාධිපත්‍ය බලය ප්‍රතික්ෂේප කරන්නත්, පාර්ලිමේන්තුවෙන් පිටත බලයක් ගැනත් එහෙන් මෙහෙන් කතා කරති.

රාජ්‍යක් නොමැති ස්වයං පාලනයක් පිහිටුවීමට නම් මෙම සමාජය මීට වඩා බොහෝ විප්ලවයන්ට පත්ව ජනතාව, පංතිය මීට වඩා දියුණු ගති ලක්ෂණයන්ගෙන් යුක්ත රැඩිකල් මිනිසුන් විය යුතුය. අපේ රටේ පමණක් නොව මුලු ලෝකයම එක හා සමානව දියුණු මානව ප්‍රජාවක් බවට පත් විය යුතුය.

එවැනි ඉලක්කයක් අපට තාමත් දුර වැඩිය. ඒ නිසා දැනට මෙම සංක්‍රාන්තික අවධිය අප නුවනින් විමසා බලා ජනතාවාදී පාලනයක් බිහිකිරීම වෙනුවෙන් උත්සුක විය යුතුය. එසේම එය පවත්වාගෙන යාම සඳහා අපගේ සියලු ශක්තිය යොදවා සාමූහිකව වැඩ කළ යුතුය.

දැනුම 11

කේම්බ්‍රීය කේම්බ්‍රියානු යුගය පිළිබඳ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අප මෙවර කලාපයෙන් ඕර්ඩොවිසිය යුගයේ දී සිදු වූ පාරිසරික විපර්යාස සහ ජීවීන්ගේ වෙනස්කම් පිළිබඳ සාකච්ඡා කරමු.

# ගොඩ්වානාලන්තය වසා හිම මිදෙයි

**ඕර්ඩොවිසිය යුගය - (වසර මිලියන 500ට පෙර සිට - 440 දක්වා)**

ජීවීන් මෙතෙක් කල් කළ පරිදි ජලයේ දිය වූ ඔක්සිජන් අවශෝෂණය කරගැනීම වෙනුවට වාතයෙන් ඔක්සිජන් උරාගැනීම සඳහා අවශ්‍ය ඉන්ද්‍රියයන් හා කුසලතා වර්ධනය කරගැනීම ආරම්භ වුණේ මේ යුගයේදීය.

අලස ලෙස ජලයේ එහා මෙහා පිහිනා යමින් අහර සපයා ගනිමින් සිටි ස්පර්ශක නාල සහිත කුඩා මුහුදු ගෝනුස්සෝ සහ ට්‍රයිලොබයිටයෝ කෙමෙන් කෙමෙන් වඳ වී ගියහ. වඳවී ගිය ට්‍රයිලොබයිටයින්ගේ පසු පරපුර කකුළුවන් ලෙස වර්ධන විය. මුහුදු ගෝණුස්සෝ කලක් ගත වූ විට ගොඩ ගෝණුස්සන්, පොකිරිස්සන්, ඉස්සන් හා මකුළුවන් බවට පරිණාමය වූහ.

ජලජ ජීවී ගහණය ශීඝ්‍රයෙන් විදාරණය වූ මෙම අවදියේ කොඳු ඇට පෙළෙහි මුල් ස්වරූපය සහිත ජීවීන්ද බහුලව ජීවත් වූහ **(Hemichoradates)**. ප්‍රථම පෘෂ්ඨ වංශිකයන්ද ඒ හා සමකාලීනව දක්නට ලැබුණි. ලෝකයේ ප්‍රථම කොරල්පර බිහි වූයේත් මෙකලමය. දැනට හමු වී ඇති මේ යුගයට අයත් විශාලත සත්වයා මීටර් 1ක් දිගැති පිටකටුවකින් යුතු යෝධ මොලුස්කයෙකි. රතු හා හරිත ඇල්ගීවලින් ජල ප්‍රදේශ පිරී ඉතිරී ගොස් තිබුණි. මූලික මට්ටමේ ගොඩබිම් ශාක වේගයෙන් වර්ධනය වෙමින් වෙරළබද ජලාශ්‍රිත ප්‍රදේශ සත්ව වාසට උචිත ප්‍රදේශ බවට පත් කරමින් සිටියේය.

පෘථිවි පෘෂ්ඨයේ හැඩරුව ප්‍රබල වෙනසකට භාජන වෙමින් තිබිණි. මේ අවදිය වන විට උතුරු අර්ධගෝලය ගොඩබිමෙන් තොර මහා සාගරය පමණක්ව පැවතිණි. ගොඩ්වානාලන්තය තවත් ගොඩබිම් පෙදෙස්ද එකතු කර ගනිමින් දක්ෂිණ ධ්‍රැවය දෙසට තල්ලු වී ගියේය. ගොඩ්වානාලන්තයේ වැඩි කොටස වූයේ ගොඩබිමට වඩා නොගැඹුරු සයුරු පෙදෙස් ලෙසය.

වසර මිලියන 440කට පමණ පෙර වනවිට දක්ෂිණ ධ්‍රැවය හා ගොඩ්වානාලන්තයේ වැඩි කොටසක් වසාගෙන හිම මිදෙමින් ගොඩ ගැසෙන්නට විය. මෙම හිම තට්ටු මීටර් දහස් ගණන් ඝණ ඒවා විය. එහි ප්‍රතිඵලය වූයේ දකුණු අර්ධගෝලයේ නොගැඹුරු මුහුදු ප්‍රදේශ සියල්ලම පාහේ සිඳී වියලී යාමයි. ලෝකයේ මුළු ජල ජීව සංහතියෙන් 60%කටත් වඩා ප්‍රමාණයක් විනාශ වී වඳ වී යාමට මෙය හේතු විය.

ඕර්ඩොවිසිය යුගයෙන් පසු එළඹෙන සිලූරිය යුගයේදී ජීවීන් පරිණාමය වන ආකාරය අප මීළඟ කලාපයේ දී විමසමු.



# රටේ අර්බුදය හමුවේ ක්‍රීඩාවේ හෙට දවස

අරගල භූමියේ තැනින් තැන නැගී එන සටන් පාඨ අස්සේ පාලකයන්ගේ අසමත්කමේ ප්‍රතිඵල ප්‍රකාශයට පත්වෙයි. මාලිගා කුමන්ත්‍රණයෙන් බලයට පැමිණි පිං අගමැති ඔවුන්ගේ පරම්පරාවේ අසමත්කමේ පුරාජේරුව ඉදිරිපත් කරයි. එය ධනපති පන්තියේ මරණයේ අඳෝනාවයි.

වසර 74ක පාලකයන්ගේ අසමත්කම ආර්ථිකයට පමණක් නොව සියලුම ක්ෂේත්‍රවලට බලපා ඇති අතර බොහෝ ක්ෂේත්‍ර මේ වන විටත් බිඳ වැටී අවසන්ය. එහි ප්‍රතිඵලයක් ලෙස ලාංකේය ක්‍රීඩා ක්ෂේත්‍රයද දරුණු කඩා වැටීමකට ලක් වී ඇත. එය ආර්ථික අර්බුදයම නොව ප්‍රතිපත්තියක් නොමැතිව ඉදිරියට ඇදුණු ක්‍රියාවලියේ දිගුවකි.

මේ මොහොත වන විට පාසල් මට්ටමින් පැවති සියලුම ක්‍රීඩා නැවතී ඇති අතර ග්‍රාමීය මට්ටමින් ක්‍රීඩාවේ නියැලුණු තරුණ තරුණියෝ එය පවත්වා ගැනීමට නොහැකිව ක්‍රීඩාව අතහැර ගොස්, ජීවත්වීමේ අරගලයට මුහුණ දෙමින් සිටිති. ආහාර අර්බුදය නිර්මාණය වීමත් සමඟ පෝෂ්‍යදායී ආහාර වේලක් නොමැති වීම නිසා ක්‍රීඩාවේ නියැලී සිටින අය මෙන්ම නියැලීමට බලාපොරොත්තුව සිටින අය පවා ඉදිරියේදී තවත් දුර්වල විය හැකිය. මෙවැනි බේදවාචකයක් හමුවේ ගම් මට්ටමේ සිට නගරය දක්වාත් ආධුනික මෙන්ම ජ්‍යෙෂ්ඨ ක්‍රීඩකයින් දක්වාත් රැකබලාගැනීමට පාලකයින්ට වැඩපිළිවෙළක් නොමැත. අවම මට්ටමින් හෝ පවත්වා ගෙන යන්නේ ක්‍රිකට් ක්‍රීඩාව පමණි. එහෙත් ඉදිරියේ පවතින අර්බුදය හමුවේ දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයින් පවා ක්‍රීඩාව අත්හැරිය හැකිය. එයට හොඳම උදාහරණය පෙට්‍රල් ලීටරයක් වැයකොට ක්‍රිකට් ක්‍රීඩකයෙකු රැකගැනීම වෙනුවෙන් මැදිහත් වීමට උත්සාහ කරන කණ්ඩායමයි.

එහෙත් අපි නොදන්නා දක්ෂ ක්‍රීඩකයින් කොපමණ ප්‍රමාණයක් ක්‍රීඩාව අතහැර ඇද්ද? එය අපි සංඛ්‍යාලේඛන අනුව නොදන්නෙමු. එහෙත් ක්‍රිකට් කණ්ඩායමේ ජයග්‍රහණ ප්‍රතිඵල දකින විට අපට නිශ්චිත කරගත හැකිය.

මෙවැනි අවස්ථාවක "දේශපාලනය අදාළ නෑ. අපි මැච් බලන්ඩ ආවා" යනුවෙන් කෙනෙකුට කිව හැකිය. එහෙත් අපට කීමට ඇත්තේ අද නියං කාලයට වහින එක් වැස්සක් මෙන් එක තරඟයක් ජයග්‍රහණය කරන්නේ අපේ රටේ දේශපාලනය කළ විනාශයේ ප්‍රතිඵල නිසා මිස ක්‍රීඩකයින්ගේ දුර්වල පන්දු රැකීම, පිතිකරණය හෝ පන්දු යැවීම නිසා නොවන බවයි. ඉදිරියේ නිර්මාණය වන දැවන්ත ආර්ථික අර්බුදය හමුවේ ක්‍රීඩාවද දැවන්ත අ ර් බු ද ය ක ට ලක්විය හැකිය. එය රැකගැනීමට හැකි වන්නේ නිවැරදි දේශපාලනයක් හරහා රට නිවැරදි දිශාවට රැගෙන යාමෙන් පමණි. ඒ වෙනුවෙන් වසර 74ක මේ විනාශකාරී පාලනය අවසන් කොට ජනතාවාදී පාලනයක් ගොඩනැගිය යුතුයි.



# කවි නිම්නය

**ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්**
ඔබගේ කවි නිර්මාණ අප වෙත එවන්න.
අප සූදානම් ඔබගේ නිර්මාණ සඳහා ඉඩක්
FORWARD කවි පිටුවේ වෙන් කරන්න.
මෙන්න අපගේ ලිපිනය
FORWARD කවි පිටුව,
අංක464/20, පන්නිපිටිය පාර,
පැලවත්ත, බත්තරමුල්ල.
syuforwardnews@gmail.com

## "ඔවුහු ඔබට අසීමිතව ප්‍රේමකළහ!"

සරුසාර හෙටක් වෙත උර තියා දුන්න
කරුවක් ය බිම හෙළා දිවි අහිමි කෙරුණ
විරු ඔබෙන් ඒ හැලුණ ලේ කඳුලු ගොන්න
හිරු නැගෙන්නට කියන මල් සුවඳ වැන්න

]මියැසි රසාංජලී - අනුරාධපුර[



## සඳ මඬලේ සිට දිවැස් හෙළන පුතුණේ

සුදු පාට ඇත් පොව්වො ගොඩ නොවන් හීනයට
මිතුරියක් අරන් එමි හැම මාසේ 28 ම
සඳ මඬලේ සිට දිවැස් හෙළන නුඹව
තුරුලට එනු පමාවනු පිණිස...

පොහොර නැතිව පුරන් වූ කුඹුර අතහැර
අරගලේ රෑ දිවා ගෙවමි නිදි නැතිව
බෙහෙත් කිරි නැති රටකට
නුඹ ගෙනත් සැනහෙනු අපි කොහොම?

කපුටන් වසුරු විසුරවපු පොළොවක
හුස්ම අල්ලා නොසිටිය යුතුය නුඹ
එක යායට රතු මල් පිපුණු පළසකට
බැහැපන් පුතුණි කවදහරි දවසක!

]යශෝධා සමරධීර - අම්පාර[

## අලුත් අහසක්

ගිනිගත් රටක මළ අළු සෝදා ගන්ට
නැවුම් වැහි පොදක් ඒවි ද අද හෙටම?
කන් අඩි රිදුම් දෙන විලාප උහුලන්ට
මොර දී හඬන්නට හිත් ලෑවා දුකට

මස් නැති ඇට සැකිලි හිස් මොළගෙඩි දෙන්ට
දත නිය කනවා උන් උන්ටම ජය වෙන්ට
රත්කර යකඩ හදවත කරගැට එන්ට
එක්වෙමු වීරියෙන් පරයන් එලවන්ට

රකිනට ඉතිරි පොළවේ හුස්මත් ඔන්න
ලේ මස් දන් දුන්නා රළුවුණ අරගලය
මහ ගිනි අව්වෙ ලේ රත්කර ගත් උන්ට
නොහැකිද රුහිරයෙන් රතු මල් පුබුදන්ට?

] හංසිකා ප්‍රියදර්ශනී - අම්පාර[



## එක්ව රොක්ව ජයකුඹ වෙත

නිවට නියාලුවන් රජ පුටුවල අද
සැබෑ වීරයින් හට ගිණි බිඳිනා කල
අයුක්තියේ ඒ ඝෝෂර හැඩි නද
රටක් වේලාලූ සමයක අභිමුව
කොඳු ඇති හිත් දැඩි අභීත විරුවන්
සටන් වැදෙයි නොබියව
ඔවුන් ඉදිරියෙ දණ නොම නම....

ඉතිං වැසියනේ දෙසවන් යොම මැන
ඔවුන් සටන් වදිනා ඒ හඬ වෙත
නඟනු දිරිය දෑතේ වෙර ඔවුනට
යමව් එක්ව රොක් වී හැම එක
ලෙස...!

] බුද්ධික ලක්ෂාන් හේරත්  - කුරුණෑගල[



## අදින් මතු

අඬ හඬේ අමුණලා බුදු පිළිම කඩාවී
ජුම්මාව බිඳහෙලා කුරුසෙ අමුණාවාවී
ත්‍රිශූලය උල් කරයි, අනින්න ම බලාවී
දම් සකය රජු අතේ වටේ කරකවාවී

ෆාතිමා අපි නෙවෙයි පල්ලියට ගහන්නේ
ක්‍රිස්ටිනා අපි නෙවෙයි කුරුසෙ ගිනි තියන්නේ
නඩේශන් අපි නෙවෙයි කෝවිලුත් කඩන්නේ
බුදුපිළිමෙකට වුණත් රජාමයි ගහන්නේ

සෑ මලුවෙ දිවුරුවත් උන් පිරිත් අහන්නෑ
සිවුරු මිතුරන් ඇතත් රජුට ආගමක් නෑ
පල්ලියට කෝවිලට බිඳක් ආදරේ නෑ
මේ වගේ උන් තවත් මේ රටට වැඩක් නෑ

අයෝමා ෆාතිමා ක්‍රිස්ටිනා සරෝජා
නඩේශන් මොහොමඩුයි සුමනසිරි පෙරේරා
ඉක්මණට එක්වෙන්න ආදරේ පිරිවරා
ලිප්ටනේ බලාගෙන සියල්ල ම එනතුරා

]පසිඳු විජේනායක - හම්බන්තොට[

# නව පකිස්ථානයක් නිර්මාණය කිරීමේ කඩවුණු පොරොන්දුව




1947 අගෝස්තු 14 වෙනිදා පකිස්ථානය වෙනම රාජ්‍යක් ලෙස ඉන්දියාවෙන් වෙන්වන විට, එවකට ලෝකයේ විශාලතම මුස්ලිම් රාජ්‍යය පිහිටුවීම සිදුවිය. අද වනවිට මිලියන 212.2 වන ජනගහනයකට උරුමකම් කියන පකිස්ථානය දැනට ලොව පස්වැනි විශාලතම ජනගහනය හිමි රටයි.

එහි අතිමහත් ජනගහනයක් සිටියද, පකිස්ථානය ජාතික අනන්‍යතාවයක් නිර්වචනය කිරීමට සහ එහි භාෂාමය වශයෙන් විවිධ වූ ජනගහනය සඳහා දේශපාලන ක්‍රමයක් පරිණාමය කිරීමට අවිනිශ්චිත අරගලයක තවමත් නියැලී සිටී. පකිස්ථානයේ භාෂා විස්සකට වඩා වැඩි ප්‍රමාණයක් ඇති අතර විවිධ උපභාෂා 300කට අධික ප්‍රමාණයක් ඇත. උර්දු සහ ඉංග්‍රීසි රාජ්‍ය භාෂා වන නමුත් පන්ජාබි, සින්දි, පෂ්තු, බලුචි සහ සෙරයිකි යන එහි ප්‍රධාන භාෂා ලෙස සැලකේ. මෙම විවිධත්වය නිදන්ගත කලාපීය ආතතීන්ට හේතු වී ඇති අතර ව්‍යවස්ථාවක් සැකසීමේදී අනුක්‍රමික අසාර්ථකත්වයන් ඇති කර තිබේ. ඉන්දියාව සමඟ පූර්ණ පරිමාණයේ සීතල යුද්ධ සහ සතුරු මානසිකත්වය හා වයඹ දේශසීමා සහ ආර්ථික අර්බුද මාලාවකින් පකිස්ථානය මත බර පටවා ඇත.

පකිස්ථානය තුළ පළාත් අතර පවතින විරසකයන් මෙන්ම ඉන්දියාව සමග පවතින දේශසීමා ගැටුම්, කාලයාගේ ඇවෑමෙන් පාකිස්ථානයේ දේශපාලන අස්ථාවරත්වය ඇති කිරීමට හේතුවිය. ජාතික වශයෙන් පදනම් වූ දේශපාලන පක්ෂයක් නොමැති තත්වයක් තුළ, පකිස්ථානයට දිගු කලක් තිස්සේ රජයේ අඛන්ඩතාවය පවත්වා ගැනීම සඳහා සිවිල් සේවය සහ හමුදාව මත විශ්වාසය තැබීමට සිදුවිය.

පකිස්ථානය, වසර 75ක් කිසිවිටෙක නිදහසේ, සම්පූර්ණ දේශපාලන සාමකාමී කාලයක් ගත නොකළේය. හමුදා කුමන්ත්‍රණ පවතින අතර කිසිම අගමැතිවරයකු වසර පහක පූර්ණ ධුර කාලයක් සම්පූර්ණ කර නැත. පසුගියදා අගමැති ඉම්රාන් ඛාන් විශ්වාසභංග යෝජනාවකට මුහුණ දීම සහ ඉන් පරාජයට පත්වීම සිදුවිය.

ඉම්රාන් ඛාන්ගේ පකිස්ථාන් ටෙහ්රීක්-ඊ-ඉන්සාෆ් (පී.ටී.අයි) පක්ෂය 2018 දී බලයට පත් වූ විට, දූෂණයට එරෙහිව සටන් කිරීමට, අබලන් වන ආර්ථිකය ශක්තිමත් කිරීමට සහ ස්වාධීන විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට ඔහුගේ ආධාරකරුවන්ට සහතික වෙමින් නව පකිස්ථානයක් නිර්මාණය කිරීමට පොරොන්දු විය.

දූෂණයෙන් තොර, දුප්පතුන්ට වැඩි ආර්ථික අවස්ථාවක් පොරොන්දු වූවද අද වනවිට ඛාන් එය ඉටු කිරීමට අපොහොසත් වී ඇත. උද්ධමනය, විරැකියාව ඉහළ යමින් පවතී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ඩොලර් බිලියනයක වැඩපිළිවෙල කාරණා ස්ථාවර කිරීමට උදව් කර නැත. **Pandora Papers** නමින් හැඳින්වෙන මුදල් පිළිබඳ ජාත්‍යන්තර පරීක්ෂණයකින් පෙන්නුම් කළේ ඛාන්ගේ ජනප්‍රිය වාචාල කතාවලට පටහැනිව, ඛාන්ගේ අභ්‍යන්තර කවය බදුවලින් වැළකීම සඳහා මුදල් විදේශගත කර ඇති බවයි.

එපමණක් නොව ඛාන් විරුද්ධ පක්ෂ ඉලක්ක කර ගනිමින් දූෂණ විරෝධී මායාකාරියන්ගේ දඩයම මෙහෙයවීය. ඇත්ත වශයෙන්ම විරුද්ධ පක්ෂ, ඔවුන්ගෙන් බොහෝමයක් රාජවංශ නායකත්වයෙන් සහ පැරණි මුදල් ඇති පවුල්වලින් සමන්විත වන අතර, දූෂිතද වේ. ඛාන් නෙරපා හැරීමට ඔවුන් දරණ ලද උත්සාහය සඵල වීම, දූෂණ පිළිබඳ විමර්ශන මගහැරීමේ පියවරක් ලෙස සැලකිය හැකිය.

අග්‍රාමාත්‍ය ඉම්රාන් ඛාන්ට එරෙහිව විපක්ෂය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද විශ්වාසභංගය පරාජය වීමත් සමඟ පකිස්ථානය නැවතත් කැළඹීමට ලක්වී තිබේ. මේ වනවිට පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුව විසුරුවා හැර රටේ මැතිවරණ කොමිසම යටතේ භාරකාර රජයක් අධීක්ෂණය කරනු ඇති අතර එය විපක්ෂ නායක ෂෙබාස් ෂරීෆ් විසින් මෙහෙයවනු ලබයි. (ෂරීෆ් යනු හිටපු අගමැතිවරයෙකු වූ නවාස් ෂරීෆ්ගේ සොහොයුරෙකි.)

මින් පෙන්වනු ලබන්නේ තනිපුද්ගලයකුට රටක් ගොඩනැගීම කළ නොහැකි බවත් ඒ සඳහා ප්‍රතිපත්තිගරුක මිනිසුන්ගෙන් සමන්විත බලවේගයක අවශ්‍යතාවය පවතින බවත්ය. සමාජ පරිවර්තනයක් උදෙසා මුළුමහත් පුරවැසියන් දායක කරගත යුතු වේ.

පකිස්ථානයේ කොමියුනිස්ට් පක්ෂය අදහස් දක්වමින් කියා සිටින්නේ, මේ සියලු සූරාකෑමේ බලවේගයන්ට එරෙහිව විප්ලවයකින් නැගී සිටීම හැර වෙනත් විකල්පයක් පුරවැසියන්ට නොමැති බවයි. සමාජවාදය ගොඩනැගීමට සහ කම්කරු පන්තියේ සහ මහජනතාවගේ පාලනය ගෙන ඒමට පුරවැසියන් මෙහෙයවිය හැක්කේ විප්ලවයකට පමණි. නිදහස් අධ්‍යාපනය, සෞඛ්‍ය පහසුකම්, විරැකියාවෙන් තොර සැබෑ සුබසාධන රාජ්‍යයක් ලබා දිය හැක්කේ සමාජවාදයට පමණි. සමාජවාදී රාජ්‍යයක් තුළ රටේ සම්පත් භාවිත කරනු ලබන්නේ එහි ජනතාවගේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා මිස අවි ආයුධ සහ කඩාකප්පල්කාරීත්වය සඳහා නොවේ.

පකිස්ථානයේ කොමියුනිස්ට් පක්ෂය කම්කරුවන්, ගොවීන්, කාන්තාවන්, ශිෂ්‍යයන් සහ මහජනතාවට පොදුවේ ආයාචනා කරන්නේ ඔවුන්ගේ සැබෑ හොරණෑව සහ නියෝජිතයා වන, පීඩාකාරී දේපළ හා ධනේශ්වර පංතිවලට එරෙහිව සැබෑ සටන් යන්ත්‍රය වන, එම පක්ෂයේ වේදිකාවට රොක් වන ලෙසයි. දශක ගණනාවක් තිස්සේ පීඩිතයා වෙනුවෙන් පීඩකයාට එරෙහිව අරගල කළ **CPP** හි නායකත්වය සහ කම්කරුවෝ සමාජයේ වරප්‍රසාද නොලත් සහ පීඩිත කොටස්වලට අහිමි කළ අයිතීන් වෙනුවෙන් අරගල කරමින් දැඩි ලෙස සටන් කරමින් සිටිති.

අද වනවිට ලංකාව තුළ පවතින දේශපාලන අර්බුදය සඳහා පකිස්ථානය තුළින් ගත හැකි ආදර්ශය වන්නේ හුදෙක් පුද්ගල මාරුවකට පමණක් රටක් ගොඩනැගිය හෝ වෙනස් කළ හෝ නොහැකි බවයි.



ආගම බිහිවීම-13 කොටස

**පසුගිය කලාපයෙන් අප වෙත ගෙන එනු ලැබුවේ අලි කාලිෆ් තනතුර සඳහා පත්වීම පිළිබඳවය.**

# ඉස්ලාම් දහම තුළ කාලිෆ් තනතුර සඳහා පැවති ගැටුම්

අලි තමන්ගෙන් පසු කාලිෆ්වරයා ලෙස මුවාවියාහ්ව නම් කර තිබුණි. ඒ කොන්දේසියකට යටත්වය. එනම් මුවාහ්වියාහ් ගෙන් පසු කාලිෆ් තනතුර අලිගේ පුත්‍රයන්ට, හසන් සහ හුසේන්ට ලබා දිය යුතුය යන්නයි.

අලිගේ මරණයෙන් පසුව කාලිෆ්වරයා ලෙස ඔහුගේ වැඩිමහල් පුත්‍රයා හසන් පත්විය. හසන් මුවාවියාහ්ත් සමඟ සටන් කිරීම වෙනුවට සාකච්ඡා මාර්ගයෙන් විසඳුම් අපේක්ෂා කළේය. ඒ අනුව හසන් මුවාවියාහ් සමඟ ගිවිසුමකට එළඹුණි. එම ගිවිසුමේ කොන්දේසි අනුව මුවාවියාහ් කාලිෆ්වරයා වශයෙන් පත් වීමත් මුවාවියාහ්ගෙන් පසුව හසන් කාලිෆ්වරයාව වශයෙන් පත්වීමද ඊට පෙර හසන් මියගියහොත් ඔහුගේ සොයුරු හුසේන් කාලිෆ්වරයා වශයෙන් පත්වීමටද නියමිතව තිබිණි. ඒ අනුව හසන් කාලිෆ් තනතුරෙන් ඉවත් වී මුවාවියාහ් කාලිෆ් තනතුරට පත් කෙරිණි. මේ අය උමයියිඩ් කාලිෆ් රාජ්‍ය ඇරඹුමයි. හසන් මදිනාවේ පදිංචියට පැමිණි අතර ඔහු මුවාවියාහ් ආධාරකරුවන් මෙන්ම තමාගේ ආධාරකරුවන්ගෙන්ද අපවාදයට ලක් විය. හසන් 676 දී මුවාවියාහ්ද් විසින් වස දීමෙන් මිය ගියේය.

හසන්ගේ මරණයෙන් පසු මුවාවියත් ගිවිසුම බිඳ දමමින් තමන්ගේ අනුප්‍රාප්තිකයා ලෙස ඔහුගේ පුත්‍රයා වූ සෙයිඩ් යසීද්ව නම් කරන ලදී. ක්‍රිස්තු වර්ෂ 680 දී මුවාවියාහ්ද් මිය ගිය අතර සෙයිඩ් යසීද් කාලිෆ්වරයා වශයෙන් පත් විය. අනිකුත් පුත්‍රයා විසින් මෙයට එරෙහි වූ අතර ඔහු තම පවුලේ සාමාජිකයන් සමඟ මදිනාවෙන් මක්කමට පලා ගොස් එහිදී සෙයිඩ්ට එරෙහිව සේනා සංවිධානය කරන්නට විය. සෙයිඩ් තම අගනුවර ලෙස ඉරාකයේ කූෆා නගරය තෝරාගත්තද එහි වැසියන් හුසේන්ට එහි පැමිණෙන ලෙස ආරාධනා කළේය. හුසෙන් කූෆා නගරයට ගියහොත් එහි වැසියන් තමාට විරුද්ධව කැරැල්ලක් ඇතිකරන බවට බිය වූ සෙයිඩ් යසීද් හුසේන් කූෆා නගරයට පැමිණීම වැළැක්වීමට හමුදාව එවීය.

කර්බාලා නගරය ආසන්නයේදී සෙයිඩ්ගේ හමුදාව හා හුසේන් ඇතුලු ඔහුගේ පිරිස එකිනෙක හමු වූ අතර එහිදී ඇතිවූ ගැටුමෙන් හුසෙන් ඇතුළු සියලු දෙනා මරා දමන ලදී. මෙම සිද්ධියෙන් පසුව සෙයිඩ් යසීද්ට විරුද්ධව තවත් කැරැල්ලක් ඇති විය. මෙය සිදු කළේ පළමු කාලිෆ්වරයා වූ අබූ බකර්ගේ මුණුපුරා වූ සුබායිර්ය. මක්කම සිට එම කැරැල්ල අරඹන ලදී. හුසේන්ගේ ඝාතනය ගැන කෝපයට පත් විශාල පිරිසක් සුබායිර්ට සහය දුන් අතර දකුණු අරාබිය සහ ඉරාකය තුළ විශාල බල ප්‍රදේශයක බලය සුබායිර් විසින් අල්ලා ගන්නා ලද නමුත් සෙයිඩ් යාසීන් විසින් පසුව සුබායිර්ව පරාජය කර මරා දමන ලදී.

අරාබිය වැඩි වශයෙන් කාන්තාර බැවින් අරාබියට තම ජනතාව නඩත්තු කිරීම දුෂ්කර කටයුත්තක් විය. ඉස්ලාම්වරුන් ප්‍රථම ආක්‍රමණය, හුදු ද්‍රව්‍ය පැහැර ගැනීම සඳහා කඩා වැදී මිය ගිය සතුරාගේ දුබලකම මත අල්ලා ගත් භූමිය තුළ පදිංචි වීම විය. කාන්තාරයේ කොනක යන්තම් දිවි පෙවත රැකගත් දිළිඳු හා දුෂ්කර ජීවිතයක් ගත කළ ජනකායක් ඉස්ලාමය ඇරඹීමෙන් විසි වසරක් තුළදී හදිස්සියේම ලෝකෙ ඉතාමත් සරු සාර භූමි ප්‍රදේශ රැසක ස්වාමීන් බවට පත්විය. මුස්ලිම් විසින් අල්ලාගත් රටවල සිවිල් පාලනය වෙනස් නොකරම වාගේ පවත්වාගෙන ගියේය. පර්සියාවේද බයිස්ටයින් අධිරාජ්‍යයේද සිවිල් පාලනය අරාබින්ට වඩා ඉතා උසස් තත්වයක පැවතිණි. මුලදී අරාබි ගෝත්‍ර නායකයන්ට එහි සංකීර්ණත්වය කිසිසේත් නොතේරෙන බැවින් යටත් වූ රටවල් අල්ලා ගැනීමට පෙර සිටි පාලන කටයුතු භාර පුද්ගලයන්ගේ සේවය ලබා ගැනීමට අත්‍යවශ්‍ය විය. මුස්ලිම්වරුන් සැලකිය යුතු මට්ටමකින් අඩු කරන ලද බැවින් යටත් රටවල් ජනතාවගෙන් සමහරු කප්පම් ගෙවීමෙන් බේරීම සඳහා ක්‍රිස්තියානිය අතහැර ස්වකැමැත්තෙන්ම ඉස්ලාම්වරු වූහ.



වමට



# අධිරාජ්‍යවාදය ධනපති ක්‍රමයේ මළගමයි

දහනව වැනි සියවස අවසානයේ දී සහ විසිවන සියවස ආරම්භයේ දී ධනවාදී සමාජ ආර්ථික ව්‍යුහය තුළ විශේෂ වෙනස්කම් සිදුවිය. විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රයේ අංශ තුළ විශාල වර්ධනයක් පෙන්නුම් කරනු ලැබීය. ප්‍රවාහන හා සන්නිවේදන මාධ්‍යවලද විශේෂ වර්ධනයක් ඇතිවිය. මේ සියල්ල මහා පරිමාණ ව්‍යාපාරවල විශාල වර්ධනයක් ඇති කිරීමට හේතු විය.

මේ නිසා ධනය කේන්ද්‍රගත වීම සීඝ්‍රයෙන් සිදුවන්නට විය. ඒකාබද්ධ කොටස් හිමි සමාගම්ද බහුල විය. මේ සමඟම එතෙක් පැවති ධනේශ්වර ක්‍රමය එනම් තනි තනි ධනපතීන් අතර වන නිදහස් තරඟය ප්‍රධාන ලක්ෂණය වූ ධනපති ආර්ථික ක්‍රමය වෙනුවට ඒකාධිකාරය බිහිවිය.

මෙම විශේෂ වෙනස්කම් සිදු වූ කාලපරිච්ඡේදය විස්තර කිරීම සඳහා අධිරාජ්‍යවාදය යන වචනය භාවිතා කරනු ලැබීය. ඉංග්‍රීසි ජාතික ආර්ථික විද්‍යාඥයකු වූ ජේ. ඒ. රොබ්සන් විසින් ලියන ලද අධිරාජ්‍යවාදය නැමැති පොත 1902 දී ලන්ඩන්හි හා නිව්යෝර්ක්හි පළවිය.

ධනවාදය තුළ සිදු වූ මෙම විශේෂ වෙනස්කම් හා ඒ පිළිබඳ වූ අර්ථ නිරූපණ පිළිබඳ ගැඹුරු අධ්‍යයනයකින් පසු අධිරාජ්‍යවාදය ධනපති ක්‍රමයේ ඉහලම අවධිය නැමැති කෘතිය ලෙනින් විසින් 1916 දී ලියනු ලැබීය. ඔහු විසින් අධිරාජ්‍යවාදය පිළිබඳ නිවැරදි ආර්ථික හා දේශපාලන විවරණයක් ඉදිරිපත් කරනු ලැබිණි.

ධනවාදී මුල්ම අවධිය වූ නිදහස් ධනවාදයෙන් අධිරාජ්‍යවාදය වෙන්කර හඳුනාගත හැකිය. එහි මූලික ලක්ෂණ පහක් ලෙනින් විසින් පෙන්වා දෙනු ලැබීය.

**01. නිෂ්පාදනය සංකේන්ද්‍රණ වීම හා ඒකාධිකාරී තිබීම.**

**02. කාර්මික ප්‍රාග්ධනය හා බැංකු ප්‍රාග්ධනය සංයෝගවී මූල්‍ය ප්‍රාග්ධනය බිහිවීම හා මූල්‍ය කතිපයාධිපතිත්වයක් ඇතිවීම.**

**03. භාණ්ඩ අපනයනය වෙනුවට ප්‍රාග්ධන අපනයනය කිරීම වැදගත් ලක්ෂණයක් ලෙස ඇතිවීම.**

**04. ජාත්‍යන්තර ඒකාධිකාරී ධනපති හවුල් සමාගම් පිහිටුවීම හා ලෝකය ඔවුන් අතර බෙදාගැනීම.**

**05. විශාල ධනපති බලවතුන් අතර ලෝකය භෞතිකව බෙදාගැනීම.**

නිදහස් තරඟය යටතේ පැවැති ධනවාදී න්‍යායන් අභියෝගයට ලක් කෙරෙන නව තත්වය අධිරාජ්‍යවාදය යටතේ නිදහස්කරණයේ වෙළෙඳපොළ ස්වරූපය යටපත් කරමින් වෙළෙඳපොළ පුළුල් විය. ඉන් එක් ධනපති පිරිසක් ආර්ථිකයේ ඉහළම ප්‍රතිලාභ භුක්ති විඳින අතර තවත් ධනපති කොටසකට වෙළඳපොළෙන් ඉවත් වීමට සිදු වේ.

මෙම නව තත්වය ඇති වනුයේ වෙළෙඳපොළ මිල ක්‍රියාකාරීත්වය නිදහස් තරඟයට පත් කරමින් ක්‍රියාත්මක වීම හේතුවෙනි. පිරිසකගේ නිෂ්පාදනය කඩා වැටෙන අතර තවත් පිරිසකට ඒ වෙළඳපොළ කොටසටද හිමිවෙමින් නිෂ්පාදනය පුළුල් කිරීමේ අවස්ථාවක් මේ නිසා උදාවීමෙන් නිෂ්පාදනය සංකේන්ද්‍රණය සිදුවේ.

ඒකාධිකාරිය යනු මහා පරිමාණයේ ව්‍යාපාරයක් හෝ ව්‍යාපාර සමූහයක එකතුවකි. ඒකාධිකාර තරඟය අහෝසි කිරීම හෝ සීමා කිරීම හෝ මගින් තමන්ගේ නිෂ්පාදනය සඳහා ඉහල මිල තීරණය කිරීමෙන් ඒකාධිකාර ලාභ ඉපයීමේ හැකියාව ලබාගනී. 1860-1870 අතර කාල පරාසය තුළ ඒකාධිකාර කළල අවස්ථාවෙන් ආරම්භ වී 1870 ආර්ථික අර්බුදයෙන් පසු එයට විසඳුමක් ලෙස කාටල (cartels), සංගත (syndicates), භාරය (trust), අවසානයේ සම්මේලන (concern) ලෙස ඉහළ මට්ටමට වර්ධනය වූ ඒකාධිකාර ආයතන ව්‍යුහයක් දක්වා වර්ධනය විය. කෙටි නිර්වචනයකින් හඳුන්වන්නේ නම් අධිරාජ්‍යවාදය යනු ඒකාධිකාරී ධනවාදයයි.

මින් කියවෙන්නේ බලවත් හා ධනවත් ජාතීන් විසින් දුබල ජාතීන් යටපත් කරගැනීම හා නැවත නැවතත් යටත් කරගැනීමයි. ලෝක යුද්ධ මෙන්ම අධිරාජ්‍යවාදී බලපෑමට යටත් වූ ගැති රාජ්‍යවල සමාජවාදය සඳහා වන නිර්ධන පන්ති ව්‍යාපාරවල උපාය මාර්ගය අධිරාජ්‍ය විරෝධය සහ ජාතික විමුක්ති අරගලය සමඟ බැඳී පැවතීම යථාර්ථයක් වන්නේද අධිරාජ්‍යවාදයේ මෙම ලක්ෂණය නිසාවෙනි.




# ‘අපි ප්‍රචණ්ඩත්වයට විරුද්ධයි! අරගලය මිනිසුන්ගේ අයිතියක්!!’

## - නීතිඥ ශානිකා ද සිල්වා -

“ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේම තියෙනවා මිනිස්සුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය, මූලික අයිතිවාසිකමක් කියලා. ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවලදී පවා පැහැදිලිවම කියලා තියෙනවා රටේ ජනතාවට, දේශපාලනඥයන්ගේ විතරක් නෙවෙයි රාජ්‍ය සේවකයන්ගේ පවා කාර්යයන් අගය කරන්න වගේම සාධාරණ විදිහට විවේචනය කරන්නත් අයිතියක් තියෙනවා කියලා. ගෝඨාගෝගම සම්බන්ධයෙන් ගත්තම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව නීත්‍යානුකූලව තිබ්බ සාමකාමී උද්ඝෝෂණයකට තමයි මැයි නම වෙනිදා පහර දෙන්නේ.

පහරදීම ගත්තොතින් ඒකෙදි චෝදනා ගණනාවක් තියෙනවා. එකක් තමයි මේ රැස්වීම කැඳවන්නේම මහින්ද, නාමල් රාජපක්ෂ, ජොන්ස්ටන් ඇතුළු පිරිස. මේ රැස්වීම කැඳවන එකේ බලාපොරොත්තුව වුණේම අගමැතිට ඉල්ලා අස්වෙන්න එපා කියලා මිනිස්සු ලව්ව කියවගන්න එක.. එතැනදී, නාමල් එක්ක සෙල්ෆි ගන්න මනුස්සයෙක් කියනවා 'අපි ගෝඨාගෝගමට ගහමු' කියලා. ජොන්ස්ටන් කියනවා 'මේක අපිට දුන්න නං අපි එක රැයින් සුද්ද කරනවා' කියලා. මේ මිනිස්සුන්ව අවුස්සන විදිහේ ප්‍රකාශ. මෙවැනි ප්‍රකාශන ඉදිරියේ වගකිවයුතු පිරිසක් විදියට මහින්දවත් නාමල්වත් ඔය කවුරුවත් ඒකට විරුද්ධ වෙන්නේ නැහැ. එයාලගෙම මිනිස්සු මේ සූදානම් වෙන්නේ නීතිවිරෝධී වැඩකට කියලා එයාලා කලින්ම දැනගෙන හිටියා.. ඒ නිසා ඒක 'අයුතු ජනරාශියක්'. 'කුමන්ත්‍රණය කිරීම සහ කුමන්ත්‍රණයකට අනුබල දීමක්'.. ඒ වගේම 'නොකර හැරීමක්'!.. මේ වගේ දෙයක් වෙනවා කියලා දැනගෙනත් ඒක පාලනය කිරීමට කිසිදු පියවරක් නොගෙන සිටීම එයාලා සිදුකරන බරපතල වැරැද්දක්.

ඒ වගේම සිදුවන අපරාධය පාලනය නොකර, නොසැලකිලිමත් විදිහට රාජකාරියෙහි යෙදෙමින් තමා දේශබන්දු තෙන්නකෝන් එතැනදී වැඩ කරන්නේ. රටේ සාමය සහ ආරක්ෂාව භාරව ඉන්න නිලධාරියෙකුගෙන් සිවිල් ජනතාව ගිහිල්ලා ආරක්ෂාව ඉල්ලද්දීත්, 'හරි අපි බලාගන්නම්' කියල කියලා, ඔවුන්ව විශ්වාස කරගෙන ඉන්දැද්දී, අර මැරයන්ට ඒමට ඉඩකඩ හදලා දීලා, අහිංසක ජනතාවට පහරදීමට ඉඩ දීලා බලාගෙන හිටපු එකට දේශබන්දු ඒ අර කුමන්ත්‍රණයේම කොටස්කාරයෙක් වෙනවා.

පහරදීමත් සමඟ ඊට විරුද්ධව රටපුරා ජනතාව නැගී සිටිනවා. එතැනදී සිද්ධවුණ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් අපි අනුමත කරන්නේ නැහැ. නමුත් රටේ සාමාන්‍ය ජනතාව මෙවැනි ප්‍රචණ්ඩත්වයකට ගෙන එන්නේම මේ මහින්ද රාජපක්ෂ, නාමල් රාජපක්ෂලා ප්‍රමුඛ පිරිස විසින් ඔවුන්ගේම උසි ගැන්වීමේ ප්‍රතිඵලයක් විදියට.

එදා ඒ සිද්ධි පදනම් කරගනිමින් 3000කට අධික පිරිසක් රට පුරාවෙන්ම අත්අඩංගුවට අරගෙන තියෙනවා. වීඩියෝ, ඡායාරූප බලමින් තවදුරටත් පිරිස් අත්අඩංගුවට ගනිමින් ඉන්නවා.. සමහර අත්අඩංගුවට ගැනීම් සිද්ධවන්නේ පොහොට්ටු ප්‍රාදේශීය මන්ත්‍රීවරුන්ගේ ලිස්ට්වලට අනුව. අත්අඩංගුවට ගැනීමේදී සමහර තරුණයින්ට දැඩිලෙස පහර දීලා තියෙනවා. විශේෂයෙන්ම අපේ වෙනත් ජාතිකත්වයන්වල, මුස්ලිම් සහ දෙමළ තරුණයින්ට දැඩි ලෙස පහරදීලා තියෙනවා. ඒ නිසා මිනිසුන්ට අදහස් ප්‍රකාශ කරන්න තියෙන මූලික අයිතිය මුළුමනින්ම මර්ධනය කරමින්, ජනතාව බිය ගැන්වීමට කළ, තවදුරටත් කරමින් සිටින 'දේශපාලන දඩයමක්' විදියට තමා අපි මේ සිද්ධීන් දකින්නෙ...

ඊට පස්සෙ ජුලි 22 ප්‍රහාරය ගත්තම ඒකත් අතිශය ම්ලේච්ඡ සහ නිර්ලජ්ජිත ප්‍රහාරයක්. ජනමතයක් නොමැතිව ජනාධිපති පුටුවට පාත් වුණු රාජපක්ෂලගෙ අනුප්‍රාප්තිකයා- රනිල් වික්‍රමසිංහ තමන්ට අභියෝගයක් වුණ අරගලකරුවන්ව මර්ධනය කරන්න තමයි මේ ප්‍රහාරය එල්ල කරන්නෙ. ජනාධිපති ලේකම් කාර්යාලෙ ඉදිරිපස ගේට් සීරෝ එකේ පිරිස සහ පුස්තකාලයෙ රැඳී සිටි පිරිස ඊට පසුදින සවස 2ට එම ස්ථානයෙන් ඉවත් වන බව

13 පිටුවට

12 පිටුවෙන්

ප්‍රකාශයට පත් කර තිබියදී කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව තමයි ආරක්ෂක අංශ යොදවලා නිරායුධ අරගලකරුවන්ට පහර දෙන්නෙ. අරගලකරුවන්ට එම ස්ථානයෙන් පිටව යන්න හෝ පිටත ඉන්න පිරිසට ඔවුන්ගේ සහයට එන්න ඉඩ නොලැබෙන ආකාරයට ගෝල්ෆේස් පිටිය අවට සියලුම මාර්ග අවහිර කරලා තමයි මේ ප්‍රහාරය එල්ල කරන්නෙ. මෙහිදී දේශීය සහ විදේශීය මාධ්‍යවේදීන්ට පවා පහර දෙනවා. පැහැරගෙන යනවා. ඒ වගේම සාමකාමී අරගලකරුවන් කිහිපදෙනෙක්ව කොම්පඤ්ඤවීදිය දුම්රිය ස්ථානය අසල රඳවගෙන අතිශය කෲර ලෙස පහර දෙනවා. ඒ වගේම අරගලකරුවන් රැඳී සිටි හට් විශාල ප්‍රමාණයක් විනාශ කරලා දමනවා ඔවුන්ගෙ බඩුබාහිරාදිය සමඟම.

ඉවත්වීම සඳහා පූර්ව දැනුම්දීමක් හෝ වෙලාවක් ලබා නොදී ඔවුන්ට පිටවිය හැකි සියලුම මාර්ග වසා දමමින් මෙලෙස නිරායුධ ජනතාවට පහර එල්ල කිරීම නීති විරෝධියි. ඒ වගේම එය ඔවුන්ගේ මූලික අයිතිවාසිකම් කඩ කිරීමක්. ඒ වගේම මාධ්‍යවේදීන්ට පහරදීම. ජාත්‍යන්තරව පවා පිළිගත් තත්වය තමයි යුධ භූමියකදී පවා මාධ්‍යවේදීන්ට ආරක්ෂාව සැපයිය

> **“අපි ආණ්ඩුවට මතක් කරනවා ඔය මොන මර්ධන නීති ගෙනාවත් මොන බිය වැද්දීම් කළත් ජයග්‍රහණය තෙක් මේ අරගලය නොනවතින බව. පාලකයන්ට වඩා ජනතාවගේ බලය බලවත් බව. ජූලි 9 කියලා දුන්න පාඩම නැවත රනිල් විසිනුත් මතක් කරගත යුතුව ඇති බවත් රටක සමස්ත ජනතාවගෙ අනාගතය වෙනුවෙන් නැඟී සිටි අරගලකරුවන්ගෙ ආරක්ෂාව වෙනුවෙන් නීතිඥ ප්‍රජාව විදියට අපි දිගටම පෙනී ඉන්න බවත් සිහි කළ යුතුමයි.”**

යුතු බව. එකී ජාත්‍යන්තර නීති පවා රනිල්ගෙ බලලෝභී ප්‍රහාරය ඇතුළෙ උල්ලංඝනය කරනවා.

මේ විදියට නිරායුධ සාමකාමී අරගලකරුවන්ට ඔවුන්ගේ ඉල්ලීම් ඉටුකිරීම වෙනුවට ම්ලේච්ඡ ලෙස එල්ල කරන ලද මේ ප්‍රහාරය නිසා අපි රටක් විදියට ජාත්‍යන්තරය ඉදිරියේ තවදුරටත් හෑල්ලුවට ලක් වෙනවා. රටවල් ගණනාවක් මේ තත්වය හෙලා දැකලා ප්‍රකාශ නිකුත් කරලා තිබුණා.

තවමත් අරගලකරුවන් ඉලක්ක කර ගනිමින් දැඩි මර්ධනයක් ක්‍රියාත්මකයි. බොහෝ දෙනෙක් අත්අඩංගුවට ගෙන තිබෙනවා වගේම තව විශාල පිරිසක් අත්අඩංගුවට ගන්න සොයමින් සිටිනවා. සුපුරුදු පරිදිම තමන්ට එරෙහිවන අය මර්ධනය කිරීමට ආණ්ඩුව යොදා ගන්නා හදිසි නීතිය, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත වැනි මර්ධන පනත් මේ සඳහා යොදා ගනිමින් තිබෙනවා. මේ මර්ධන නීති දඩමීමා කරගනිමින් අරගලකරුවන් අත්අඩංගුවට ගන්නවට වඩා පැහැර ගැනීමට ලක් කිරීමක් තමයි කරන්නෙ. මේ අත්අඩංගුවට ගන්න පිරිස් සම්බන්ධව විමර්ශන කටයුතු අවසන් කිරීමකින් තොරව මේ විදියට අත්අඩංගුවට ගැනීම හරහා පැහැදිලි වෙනවා ආණ්ඩුව මේ කරන්නෙ ජනතාව බිය ගැන්වීමක් කියලා. ඒ වගේම ඒ අත්අඩංගුවට ගන්න පිරිස වෙනුවෙන් පෙනී ඉන්න නීතිඥ ප්‍රජාව පවා රස්තියාදු කරමින් නිවැරදි තොරතුරු ලබා නොදෙමින් ඔවුන්ව පවා වෙහෙසට පත් කිරීමට මේ ආණ්ඩුව කටයුතු කරමින් සිටිනවා.

අපි ආණ්ඩුවට මතක් කරනවා ඔය මොන මර්ධන නීති ගෙනාවත් මොන බිය වැද්දීම් කළත් ජයග්‍රහණය තෙක් මේ අරගලය නොනවතින බව. පාලකයන්ට වඩා ජනතාවගේ බලය බලවත් බව. ජූලි 9 කියලා දුන්න පාඩම නැවත රනිල් විසිනුත් මතක් කරගත යුතුව ඇති බවත් රටක සමස්ත ජනතාවගෙ අනාගතය වෙනුවෙන් නැඟී සිටි අරගලකරුවන්ගෙ ආරක්ෂාව වෙනුවෙන් නීතිඥ ප්‍රජාව විදියට අපි දිගටම පෙනී ඉන්න බවත් සිහි කළ යුතුමයි. ඒ වගේම ජනතාවගෙනුත් ඉල්ලීමක් කරනවා ඔවුන් නැඟී සිටියේ ඔබ වෙනුවෙන් නිසා ඔවුන් ආරක්ෂා කිරීමේ වගකීමක් ඔබ සතුයි. ඒ වෙනුවෙන් නැඟී සිටින්න කියලා.”



# ගෝල්ෆේස් අරගල දිනපොතේ පෙරළුණු පිටු



## අප්‍රේල් 9

එදා තමයි දවස, ගෝල්ෆේස් භූමියට අරගලකරුවන්ගේ සාම්ප්‍රාප්තිය සිද්ධවුණු දවස. එකම හිස්ගොඩක්. ඔව් කොල්ලෝ කෙල්ලෝ ගොඩක්. කළු පාටට ඇඳගෙන, කළු කොඩි උස්සගෙන, එකම අරමුණක් වෙනුවෙන් පෙළගැහුණු දවස.

## අප්‍රේල් 10 -

මේ අරගල බිමේ එක රැයක් පහන් කරලා උදා වුණු අලුත් දවස. හොඳටම වැස්ස. ඒත් කොල්ලෝ කෙල්ලෝ ටික තාමත් එතන. දූෂිත ආණ්ඩුව පන්නන්න පෙරමුණේ.

## අප්‍රේල් 19 -

මේ දවසනම් ඇත්තටම දුක හිතෙන දවසක්. එදා තමයි අරගලයට සම්බන්ධ වෙලා සිටි රඹුක්කන තරුණයකු වෙඩි තියලා මරලා දැම්මේ. ඔව් ඒ අපේ කොල්ලෙක්, ඔහුගේ ජීවිතය දුන්නේ අපි වෙනුවෙන්.

## අප්‍රේල් 22 -

මේ දවස් ගාණට ගෝල්ෆේස් බිමට විවිධාකාර විරෝධතා විධි රැගෙන විශාල පිරිසක් ආවා. ඒ අතරට පාස්කු ප්‍රහාරයෙ වින්දිතයන්ට සාධාරණය ඉල්ලමින් ජෙහාන් අප්පුහාමි කලාකරුවා කුරුසයක් ඔසවාගෙන ගමන් කළ ගමනේ ගමනාන්තය ගෝල්ෆේස් පිටියෙන් අවසන් කළේ අද.

## අප්‍රේල් 23 -

එදා රඹුක්කන වෙඩි පහරින් මියගිය චමින්ද ලක්ෂාන් සොහොයුරාව සිහිකර, මිලේච්ඡ ප්‍රහාරයට විරෝධය දක්වමින් විරෝධතා පාගමනක් ගෝල්ෆේස් ඉඳලා අරලියගහ මන්දිරය දක්වා ගමන් කළා. එදා අපිට තවත් ශෝකජනක සිදුවීමකට මුහුණදෙන්න වුණා. සමාජවාදී තරුණ සංගමයත් සමඟ අරගල භූමියේ අපිත් සමඟ සිටි අපේ සොහොයුරෙක් හදිසි අනතුරකින් අපිට නැති වුණා. ඔහු නමින් තේජාන්.

## අප්‍රේල් 25 -

හදිසි අනතුරට පත්ව අපි අතරින් සමුගත් තේජාන් සඳරුවන් සොහොයුරා සිහිකරමින් පහන්සිළු දල්වමින් නිහඬියාවක් අරගල භූමියේ හැමෝම එකතු වී කළා.

## මැයි 1 -

එදා කම්කරු දිනය. ගාලුමුවදොර අරගලයට වැඩකරන පන්තියේ නොමඳ සහය ලැබෙන වෙලාවක කම්කරු දිනයේදී ගෝල්ෆේස් බිමට කම්කරුවන් එකතු වුණා. ඔවුන්ගේ සහයෝගය අරගලයට නොමඳව ලබාදෙමින් සංකේතවත් ලෙස එදින අරගල බිමේ කම්කරු දිනය සැමරුවා.

## මැයි 5 -

ගෝඨාභය රාජපක්ෂට හා දූෂිත ආණ්ඩුවට ගෙදර යන්න කියමින් ගෙන යන අරගලයේ තවත් සුවිශේෂී අවස්ථාවක් ලෙස මැයි 6 වන දින පැවැත්වීමට සංවිධානය කළ හර්තාලය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට ගෝල්ෆේස් අරගලකරුවන් පත්‍රිකා බෙදන්න ගියා.

## මැයි 6 -

එදා අරගලකරුවන්ටත්, අනිත් සියළුදෙනාටත් සුවිශේෂී දවසක්. මොකද ඉතිහාසයේ ලියවුනු හර්තාලයක් සාර්ථක හර්තාලයක් කිරීමට හැකි වුණා. ඒ වෙනුවෙන් ගෝල්ෆේස් භූමිය කළු පැහෙයෙන් සරසන්නට අරගලකරුවන් කටයුතු කරා.

## මැයි 7 -

එදා අරගල භූමිය කසාවතින් සැරසුණු දවස. මොකද ජාතික භික්ෂු පෙරමුණේ මහා සංඝරත්නය පා ගමනින් ගාලුමුවදොරට වැඩමකළා. එදා භික්ෂූන් වහන්සෙලා විශාල පිරිසකගේ ආශිර්වාදය, සහයෝගය ගාලුමුවදොර අරගලය සඳහා ලැබුණා.

## මැයි 9 -

මේ දවස ගෝල්ෆේස් අරගලකරුවන්ටත් රටේ සියලුදෙනාටත් කිසිදා අමතක නොවන දවසක් වුණා. මිලේච්ඡ ලෙස ගෝල්ෆේස් බිමට කුලී මැරයන් විසින් ප්‍රහාරයක් එල්ල වූ දවස. එදා අරගල බිමේ සිටි විශාල පිරිසක් ආබාධයට ලක් වුණා විතරක් නෙවෙයි එහි තිබුණු දේපළ විශාල ප්‍රමාණයකටද හානි සිදුවුණා. සියලුදෙනා කම්පා වූ මේ සිදුවීම සිදුවන අතරතුර ජවිපෙ නායක අනුර කුමාර දිසානායක සහෝදරයා ඇතුලු පක්ෂයේ සහෝදරයන් පිරිසක්ද, නීතිඥයන් පිරිසක්ද අරගලකරුවන්ගේ සහයෝගයට ගෝල්ෆේස් බිමට පැමිණියා.

## මැයි 10 -

වෘත්තිය සමිති මධ්‍යස්ථානය ගෝඨාගෝගමට පැමිණියා. ඒ 9 වෙනි දින එල්ල වූ ප්‍රහාරයට විරෝධය දක්වමින්.

## මැයි 15 -

9 වෙනිදා ප්‍රහාරයේදී සිදුවූ පහරදීම්වලට හා අනීතික අත්අඩංගුවට ගැනීම්වලට විරෝධතාවය දක්වමින් විරෝධතාවයක් ගාලුමුවදොරදී පැවැත්වුණා.

## මැයි 17 -

අනීතිකව අත්අඩංගුවට ගත් සියලුදෙනා වහා නිදහස් කරනු, මහින්ද ඇතුළු මැරයන් වහා අත්අඩංගුවට ගනු ලෙස බලකරමින් සමාජවාදී තරුණ සංගමය පොලිස් මූලස්ථානය අසලදී විරෝධතාවයක් කළා.

## මැයි 25 -

පසුගිය 9 වෙනිදා එල්ල කළ ප්‍රහාරයට වින්දිතයන් විසින් වූදිතයන් හඳුනාගැනීමේ පෙරට්ටුව කොටුව උසාවියේදී පැවැත්වුණා. එහිදී එකතු වූ අරගලකරුවන් නිවැරදිව නීතිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලමින් විරෝධතාවයක් පැවැත් වුවා.

## මැයි 28 -

නොනිදන අරගලයට එදා විශේෂ දවසක්. මොකද 28 වනදාට නොනිදන අරගලය දින 50ක් ගෙවා දමා අවසන්. ඒ වෙනුවෙන් කොල්ලුපිටිය මංසන්දියේ සිට විරෝධතා පාගමනින් ගෝල්ෆේස් පිටියට අරගලකරුවන් පැමිණියා.

15 පිටුවට

13 පිටුවෙන්

# ගෝල්ෆේස් අරගල........

## මැයි 31 -

එදා හොඳටම වැස්ස. අරගලකරුවන්ට සෙවණ සලසන හට් ටික ගැලවී යන තරම් හුළඟ. ඒත් අරගලකරුවන් තම අරමුණ වෙනුවෙන් සටන්කරන එක බිඳකටවත් අඩුකරන්න සූදානම් වුණේ නෑ.

## ජූනි 9 -

ගෝල්ෆේස් ප්‍රහාරයට මාසයක් සපිරෙන දවස. ප්‍රහාරයට සම්බන්ධ වැරදිකරුවන් තවම අත්අඩංගුවට ගෙන නෑ. ඔවුන්ව වහා අත්අඩංගුවට ගන්නා ලෙස බලකරමින් අරගලකරුවන් පොලිස් මූලස්ථානය ඉදිරිපිටට ගියා. එහිදී යුක්තිය වෙනුවට අරගලකරුවන්ට ලැබුණේ කඳුළු ගෑස්.

## ජූනි 14 -

එදා සමාජවාදී තරුණ සංගමයේ හට් එක ඉදිරිපිට සුප් දන්සලක් දුන්නා. පොසොන් පොහොය වෙනුවෙන්. ඒ වගේම විවෘත වීදි නාට්‍ය කණ්ඩායම අරගලයට කලාකාමීත්වය එකතුකරමින් ගෝල්ෆේස් පිටියට ආවා.

## ජූනි 22 -

පොලිසිය විසින් අත්තනෝමතිකව චෝදනා නගමින් ගෝඨාගෝගම අරගලයේ නියුතු පිරිසක් අත්අඩංගුවට ගත්තා. එරංග, ළහිරු, ජගත්, ජෙහාන්, රතිඳු, ධම්මික, පීනරතන හිමි යන පිරිස ඒ අතර වුණා.

## ජූනි 23 -

'අත්අඩංගුවට ගත් සියලු අරගලකරුවන් වහා නිදහස් කරනු' අරගලකරුවන් එකතුවෙලා විරෝධතාවයක් කළා. ඒ අවස්ථාවට විශාල පිරිසක් සහභාගි වුණා. කොම්පඤ්ඤ වීදියේ ඉඳලා පා ගමනින් ගෝල්ෆේස් දක්වා සියලු අරගලකරුවන් පැමිණියා.

## ජූනි 25 -

එදා තමයි අරගලය දේදුනු පැහැයෙන් වර්ණ ගැන්වුණු දවස. LGBT ප්‍රජාව ගෝල්ෆේස් අරගල භූමිය දක්වා පා ගමනින් පැමිණියා. එය ඉතාමත් වර්ණවත් පා ගමනක් වුණා. ඔවුන්ගේ අයිතිවාසිකම් සේම, ජීවත්වීමට සුදුසු රටක් ලබාදෙන මෙන් එයට පැමිණි පිරිස ඉල්ලා සිටියා. ඒ වගේම හවස ගෝල්ෆේස් වර්ණවත් කරමින් සංස්කෘතික වැඩසටහනක්ද පැවැත්වුණා.

## ජූනි 29 -

අරගලකරුවන් සියලුදෙනාගේ සහභාගිත්වයෙන් කොටුව දුම්රිය පොළ ඉදිරිපිටදි විරෝධතාවයක් හා රැලියක් පැවැත්වුණා. 'මර්ධනය වහා නවතනු!, අත්තනෝමතික ලෙස සිරගත කළ සියලු අරගලකරුවන් වහා නිදහස් කරනු!, කන්න නෑ, තෙල් නෑ, ගෑස් නෑ, බෙහෙත් නෑ, ජීවත්වෙන්න විදියක් නෑ, ගෝඨා-රනිල් ආණ්ඩුව පන්නමු!' එහි සටන් පාඨයි. එදින තවත් සුවිශේෂී සිද්ධියක් වුණා. ඒ තමයි අත්අඩංගුවට ගෙන සිටි එරංග, ජගත්, ජෙහාන්, ධම්මික යන අරගලකරුවන් ඇප පිට නිදහස්ව රැලියේ වේදිකාවට ගොඩවීමයි. ඔවුන් එහිදි කියාසිටියා කිසිදු සිරගත කිරීමකින් හෝ මර්ධනයකින් අරගලය නවත්වන්නට නොහැකි බවත්, අරගලය ඉදිරියට කරගෙන යන බවත්.

## ජූලි 5 -

එදා ගෝල්ෆේස් අරගලකරුවන්ට සුවිශේෂී දවසක්. මොකද දින 96ක් තිස්සේ ගෙන ගිය අරගලයේ ඉදිරි ක්‍රියාකාරී සැලැස්ම එදින අරගලකරුවන් විසින් ඉදිරිපත් කළා. එය "අරගලයේ හෙට දවස" ලෙස නම්කර තිබුණා.

## ජූලි 9 -

ඉතිහාසයේ රන් අකුරින් ලියවෙන දවසක්. පීඩනයේ හිනි පෙත්තටම ගිය ජනතාව තවත් බලානොසිට ඓතිහාසික ලෙස එක්වූ මොහොත. ඔව් එදා සුනාමියක් ආවා කොළඹට. මිනිස් සුනාමියක්. හතර වටින්ම මිනිස්සු, පීඩනයෙන් මිරිකිච්ච මිනිස්සු... ඒත් පරාජය වීමට සූදානම් නොවූ මිනිස්සු. එක් නිමේෂයයි ගියේ බැරියර් පෙරලාගෙන දැඩි ආරක්ෂාව යටතේ තිබුණු ජනාධිපති මැදුර, ජනාධිපති ලේකම් කාර්යාලය, අරලියගහ මැදුර යන ත්‍රිත්වයම ජනතාව සතුකරගත්තා. මෙය ජනපීඩක ආණ්ඩුවකට එල්ල කළ දැඩි අතුල් පහරක් වුණා.

## ජූලි 11 -

ජනතා භාරයේ තිබූ අරලියගහ මැදුරේ සංගීත සෑදැවක් පැවැත්වුණා. අරගලයෙන් හෙම්බත් වී සිටි සැමට මෙය ඉතාමත් සතුටුදායක අවස්ථාවක් වුණා.

## ජූලි 20 -

ගෝඨා පන්නා දැමීමෙන් පසු හිස් වූ ජනාධිපතිධුරයට ජනාධිපතිවරයෙකු පත්කරගන්න පාර්ලිමේන්තුවේ ඡන්ද විමසීමක් පැවැත්වූ දවස. එදා ගෝල්ෆේස් අරගලකරුවනුත් බලා සිටියේ රට ගොඩනැගිය හැකි ජනාධිපතිවරයෙකු පත්වන තුරුයි. නමුත් සියලු බලාපොරොත්තු සුන්කරමින් රනිල් වික්‍රමසිංහ වැඩි ඡන්දයෙන් තේරී පත්වුණා. එදා ගෝල්ෆේස් අරගලකරුවන් සත්‍යාග්‍රහයකද නිරත වුණා.

## ජූලි 22 -

රටම කම්පාවට පත්කළ දිනයක්. පාලකයන්ගේ අධම නිරුවත අමු අමුවේ ප්‍රදර්ශනය වූ මොහොතක්. හරියටම පාන්දර 1.11යි. නොනිදන අරගලයේ අරගලකරුවන් අවදියෙන් තාමත්. ඒ වගේම තවත් පිරිසක් එදා අවදියෙන්. ඒ වෙන කවුරුත් නෙවෙයි. පත් වූ නව ජනාධිපති යටතේ සිටින රජයේ හමුදාවයි. ඔවුන් මුගුරු, ගිනි අවිවලින් සන්නද්ධ වෙලා. ඉතාමත් ආමානුෂීය පහරදීමක් කළා. මාස 3කට ආසන්න කාලයක් ජීවත් වූ නිවහනක් බඳු හට් විශාල ප්‍රමාණයක් විනාශ කළා. ඇඟ පුරා තැලීම් තුවාල සහිතව වේදනාකාරී මතකයන් ඉතුරු කළ පහරදීමක්. ආදරයේ, සහෝදරත්වයේ බිජු වපුරමින්, ආයුධ අතින් නොදරා භාෂණය පමණක් භාවිතාකළ අරගලයට කළ ලොවම කම්පා කළ අමානුෂික පහරදීමක්. අරගලකරුවන්ට පහර දුන්නා. කෙසේනම් නිහඬව සිටින්නද? එදාම උදෑසන 9ට කොටුව දුම්රිය ඉදිරිපිට පහරදීමට විරෝධය දක්වමින් විරෝධතාවයක් පැවැත්වුණා.

## ජූලි 23 -

ජූලි 23 කියන්නේම ඉතිහාසයේ අඳුරු කළු පැල්ලම-ක් එකතුවූ දිනයක්. කළු ජූලිය!. ගෝල්ෆේස් අරගලකරුවන්ටත් ඒ දිනය අමතක කරන්න බැරි වුණා.



එදා ගෝල්ෆේස් බිමේ කළු ජූලිය සිහිගන්වමින් වැඩසටහනක් පැවැත්වුණා.

## අගෝස්තු 3 -

අරගල බිමේ සක්‍රීයව තම දායකත්වය ලබාදෙමින් කටයුතු කළ මහානාම ස්වාමීන් වහන්සේ අත්අඩංගුවට ගත්තා.

## අගෝස්තු 5 -

මහානාම හිමියන්ට කොටුව උසාවියේදී ඇප ලබාගැනීම සිදුවුණා.

## අගෝස්තු 6 -

ගෝල්ෆේස් අරගලකරුවන් සියළුදෙනා එකතු වී සංවිධානය කළ රැලිය නුගේගොඩදී පැවැත්වුණා. එහිදී පක්ෂ රැසක් නියෝජනය කරමින් විශාල පිරිසක් රැලියට සහභාගි වුණා.

## අගෝස්තු 10 -


එදා තමයි ගෝල්ෆේස් අරගලයට පාර්ශවයන් රැසකගේ සමුදීම සිද්ධ වුනේ. සමාජවාදී තරුණ සංගමය, වෙනසක තාරුණ්‍යය, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය ඇතුළු ගොල්ෆේස් අරගලයේ සිටි සංවිධාන රැසක් ඇතුළු පිරිසක් ගෝල්ෆේස් පිටියට මදකට සමුදුන්නා. ඒ අරගලය සම්පූර්ණ නැවැත්වීමට කිසිදු බලාපොරොත්තුවකින් නොවේ!.



# එකම රටක, එකම නගරයක, එකම කාලයක සිටි රැවුල්කාරයෝ දෙදෙනෙක්

## එතෙක් යටිකුරු අතට භ්‍රමණය වෙමින් තිබූ ලෝකය උඩුකුරු කළෝය.

## කාල් හෙන්රිච් මාක්ස් සහ චාල්ස් රොබට් ඩාවින්



1870 දශකයේ එකම රටක, එකම නගරයක කිසි විටෙක එකිනෙකා මුණ නොගැසුණු, එකම ආකාරයට රැවුල් වවාගත් ජාතිකත්වයන් දෙකක මිනිසුන් දෙදෙනෙක් එකිනෙකාට වෙනස් මාර්ගවල යමින් ලෝකය කළඹවමින් සිටියහ. ඒ එං ගලන්තයේ ලංඩන් හිදීය. එක් මිනිසෙක් ජුදා ජාතිකයෙකි. ඔහු නමින් කාල් හෙන්රිච් මාක්ස් විය. අනෙක් මිනිසා ඉංග්‍රීසි ජාතිකයෙකු වූ චාල්ස් රොබට් ඩාවින් නම් විය.

1800 වන විට ලෝකයේ දර්ශනය සහ විද්‍යාවේ කේන්ද්‍රය වී තිබුණේ යුරෝපයයි. නමුදු විද්‍යාවේ කේන්ද්‍රය ඒ වන විටත් මිනිසාගේ බිහිවීම පිළිබදව නිශ්චිත හා නිවැරදි ලෙස අනාවරණය කරගෙන තිබුණේ නැත. එහෙයින් මේ කේන්ද්‍රය වටා ඒ මේ අතට දෝලනය වෙමින් හා කරකැවෙමින් සිටි උගත්තු, බුද්ධිමත්තු, දාර්ශනිකයන් හා විද්‍යාඥයන් පල්ලිය විසින් දේශනා කළ සුරංගනා කතාව එනම් "දෙවියන් වහන්සේ විසින් මිනිසා මැවූ සේක" යන්න දිරවා ගත නොහැකි වුවත් ගිල දමා ඒ විඥ්ඥානවාදී චින්තනයේම ඇලී ගැලී සිටියහ. හිටි ගමන් මේ සුන්දර සහ අතිශය මනබඳිනා සුලු සිතිවිල්ල කීතු කරමින් චාල්ස් ඩාවින් නැමති රැවුල්කාරයාගේ "අපි පරිණාමය වූයේ වදුරෙක් ගෙන්" යැයි කියන ලද ඒ අප්‍රසන්න හඬ ලන්ඩන් නුවරින් පටන් ගෙන මුලු මහත් යුරෝපය පුරා නිම්නාද වෙමින් ගලා ගියේය. අනතුරුව යුරෝපා බුද්ධිමත්තු සිය දෙවුමැදුරු දෙස බැලුවේ අවිශ්වාසයෙන් හා සැකයෙනි. "මිනිසා බිහිකළේ දෙවියන් නොව, මිනිසා බිහිවූයේ වඳුරාගෙනි" යන මෙම හඬ එතෙක් යුරෝපය පාලනය කළ පල්ලිය පමණක් නොව ගෞරවනීය යුරෝපා සමාජයටද එල්ල කළ අත් බෝම්බයක් වැනි විය. සුරදූතයෙක් විලසට දෙවියන් විසින් මැවූ මිනිසා කැත වඳුරෙක්ගෙන් බිහිවී යැයි කියනු ලබන මේ බිඳ නොහෙලිය හැකි මතය ඉදිරියේ ඔවුහු අන්දමන්ද වූහ. ලෝකයේ සමස්ථ අධ්‍යාපන ක්ෂේත්‍රය පමණක් නොව විද්‍යා ක්ෂේත්‍රයද එය වෙනස් කළේය.

එවිට කාල් මාක්ස් නැමැති අනිත් මිනිසා ඩාවින් පෙන්වා දුන් මිනිසාගේ බිහිවීමේ සිට වර්තමානය දක්වා එකී මිනිසාගේ ඉතිහාසයේ පරිණාමනයේ සංවර්ධන නීතිය මේ ගෞරවනීය යුරෝපා සමාජයට පෙන්වා දෙමින් සිටියේය. ඩාවින් පෙන්වාදුන් මිනිසා බවට පත්වූ එක් වානර වර්ගයක පරිණාමය සිදුවූයේ ශ්‍රමය නිසා බවත් එය විසින් මිනිසා බිහි කළ බවත්, එතෙක් සමාජයේ ප්‍රභූ පන්තිය හා ඉඩම් හිමි රදලයින් අත තිබූ ධනය ඔවුහු උපතින් නොගෙනා බවත් ඒවා ඉතිහාසයේ සිට දුර්වලයාගෙන් බලවන්තයා උදුරා ගන්නා ලද, පැහැරගන්නා ලද හා සූරාගන්නා ලද වස්තුව බවත් මාක්ස් පැහැදිලි කළේය. රදලවාදී ඉඩම් හිමි ප්‍රභූ පන්තියේ ලේ රත් කරවූ කාල් මාක්ස්ගේ පැහැදිලි කිරීම ඉන් නැවතුනේ නැත. මේ බලවත් ඉඩම් හිමි රදල සමාජය කළ කොල්ලකාරී සූරාකෑම විසින් මිනිසා ඓතිහාසික ලෙස පන්තීන් දෙකකට බෙදා වෙන්කොට දැමූ බව මාක්ස් පැහැදිලි ලෙසත් නියත ලෙසත් පෙන්වා සිටියේය.

මේ මතයන් ඉදිරිපත් කරන විට දෙදෙනා සතුවම යම් සමාජයකට බලපෑම් කළ හැකි තමාගේම කණ්ඩායම් සිටියේ නැත. එහෙයින් ඔවුහු යුරෝපා මහද්වීපයේ උරහිස මත තනි තනිව සිටගත්හ. ඒ යුගයේ ඔවුන්ගේ ජයග්‍රහණවල අතිමහත් බව හා තීව්‍රතාවය විශ්මයජනක විය, නොවරදිනසුලු විය. අද දවස වන විට ලෝක ජනතාවගෙන් වැඩි ප්‍රමාණයක් චාල්ස් ඩාවින්ව දනී. ඊට වඩා වැඩි ප්‍රමාණයක් මාක්ස්ව දනී. එයට හේතුව චාල්ස් විද්‍යාත්මකය. විද්‍යාත්කම දේ දැනගැනීමට උගත යුතුය. මාක්ස් දේශපාලනිකය. උපතේ පටන් මියයන තුරු මිනිසා දේශපාලනික බැවින් ඩාවින්ට වඩා මාක්ස් මිනිසුන්ට ළඟ වැඩිය.

**] උපාලි ජයසිංහ [**



# ලංකාවේ දෙවන විශාලතම ජෛවගෝල වන රක්ෂිතය

පරිසරයේ කරක් ගැසීමට කැමැත්තක් දක්වන්නන්ට පාරාදීසයක් බඳු ස්ථානයකි, කන්නෙලිය. අවම වශයෙන් දින දෙකක් හෝ ගෙන ඉතා සංයමයෙන් මෙහි ගත කරන පරිසර ගවේෂකයන්ට මෙම පරිසරයේ ඇති මනරම් බව නොඅඩුව අත්විඳිය හැක.

කන්නැලිය රක්ෂිතයට පැමිණෙන්නේ නම් ගාල්ල නගරයට ගොස් ගාල්ල-උඩුගම මාර්ගය ඔස්සේ උඩුගමට පැමිණීම හෝ අධිවේගී මාර්ගයේ පැමිණෙන්නේ නම් බද්දෙගම පිවිසුමෙන් පිටවී උඩුගමට පැමිණ එහි සිට නන්නිකිත ඇළ දක්වා දිවෙන කුඩා පටු මාර්ගය ඔස්සේ කන්නෙලිය රක්ෂිත වනාන්තර පිවිසුමට ළඟා වීමට හැක.

කන්නෙලිය රක්ෂිතය යනු සිංහරාජ වනාන්තරය හැරුණු කොට තවත් ඒ හා සමාන ජෛව විවිධත්වයෙන් යුත් පරිසර පද්ධතියකි. 2004 වර්ෂයේ දී යුනෙස්කෝව විසින් අන්තර්ජාතික ජෛවගෝල රක්ෂිතයක් ලෙසින් මෙය නම් කරන ලදී. 1960 සිට 80දශකය වනතුරු තුනී ලෑලි සංස්ථාවේ තුනී ලෑලි නිෂ්පාදනයට අවශ්‍ය දැව ලබා ගනු ලැබුවේ මෙම කන්නෙලිය රක්ෂිතය විනාශ කිරීමෙන්ය. එනිසා මෙම රක්ෂිතය තුළ ප්‍රාථමික වනාන්තර දැකිය නොහැකි අතර බොහෝ විට දැකිය හැකි වන්නේ ද්විතියික වනාන්තරය. එදා සිදුකළ වන විනාශයේ සළකුණු අතරින්පතර අදටත් දක්නට ලැබේ. කලින් හෙක්ටයාර 6144ක් පුරා විසිරී තිබූ රක්ෂිතය අද වන විට හෙක්ටයාර 5305ක් දක්වා අඩුවී තිබේ.

මුහුදු මට්ටමේ සිට මීටර් 60-425ක උසින් කන්නලිය රක්ෂිතය පිහිටන අතර එහි වර්ෂාපතනය මිලිමීටර් 4645ක් වේ. කුඩා ජලධාරා 110කට අධික සංඛ්‍යාවකින් යුක්ත මෙය අනගිමල ඇල්ල(43ප), නාරංගස් ඇල්ල(70ප) යන වැදගත් ජල මූලාශ්‍ර දෙකකින්ද කබ්බලේ කන්ද, කොණ්ඩගල කන්ද ඇතුළු කඳු මුදුන් විස්සකින් පමණදයුතු වේ.

රක්ෂිතය තුළ ආරෝහක ශාක වැල් වර්ග, භෞමික ශාක, අපිශාක විශාල ලෙස දක්නට පුළුවන. වනාන්තරයේහඳුනාගත හැකි ශාක විශේෂ 301න් 155ක් පමණ ලංකාවට ආවේණික වන අතර හොර ශාක ප්‍රජාව,දුන් ශාක ප්‍රජාව, මිල්ල, දියපර, වැලිපැන්න ශාක ප්‍රජාව ලෙස ප්‍රධාන කොටස් තුනකට ශාක වර්ගකළ හැකිය. කන්නෙලියේ වාර්තා වන ආවේණික ශාක විශේෂ අතරින් අරිද්ද, ඇටඹ, මහා බදුල්ල, කළු බදුල්ල, වැලිපැන්න, කටමොට, කැකුණආදී පහතරට තෙත් කලාපයේ ශාක දක්නට පුළුවන. කිසිම තැනකින් වාර්තාව නොවන මැන්දොරා ශාකයද මෙහි දී දක්නට හැකිය. උඩවැඩියා ශාකද,කෙකටිය, අතිඋඩයාවැනි ජලජ ශාකද, මහ හැඩයා, කුඩා හැඩයා වැනි මීමන වර්ගද වෙනිවැල්, කොතල හිඹුටු වැනි ඖෂධීය ශාකද දක්නට පුළුවන.

සත්ව විශේෂවලින් පක්ෂි විශේෂ 120ක්පමණ හඳුනාගෙන තිබෙන අතර එම පක්ෂීන් අතරට ලංකාවට ආවේණික පක්ෂීන් 23න්14ක්ම මෙහි දක්නට ලැබේ. ක්ෂිරපායී විශේෂ 20ක් පමණ හඳුනාගෙන තිබෙන අතර ලෝකයේ කිසිම තැනකින් වාර්තා නොවන ලබුගම පඳුරු මැඩියා අද දකින්න ලැබෙන්නේ ලබුගම වනාන්තරය හා කන්නෙලියේදී පමණි. ශ්‍රී ලංකාව තුළ හමුවන විශාලතම සර්පයා වන ඉන්දියානු පිඹුරා, මුහුදු කරවලා, පලා පොළඟා ඇතුළු උරග විශේෂ 50 ක්ද සමනළ විශේෂ 53 ක්ද මෙහි ජීවත් වේ.

වනාන්තරය නැරඹීම කොටස් තුනකට බෙදා සිදුකළ යුතු අතර මග පෙන්නන්නෙකුගේ සේවාව අනිවාර්යය.

1. ගුහාව, මංපෙත, අනගිමල ඇල්ල මාර්ගය
2. යෝධ නවද ගස, නාරංගස් ඇල්ල මාර්ගය
3. කම්බගල කන්ද මාර්ගය

මෙම සංචාරයේදී අප ප්‍රවේසම් විය යුතු කාරණා කිහිපයකි. සංචාරය අතරතුර කිසිවෙකුට කිසිදු දිය ඇල්ලකට බැසීම තහනම් වන අතර සංචාරය අවසානයේ පිවිසුම් දොරටුව අසල ඇති දිය පහරින් ස්නානය කිරීමට හැක. කිසිඳු ආකාරයක මත්ද්‍රව්‍ය, දුම්වැටි රැගෙන ඒම තහනම් වන අතර ආහාර ද්‍රව්‍ය රැගෙන ආවද පොලිතින් භාවිතය අවම කිරීමට සිදුවේ. පරිසරයට කිසිදු ද්‍රව්‍යයක් මුදාහැරීම සපුරා තහනම්වේ.අපගේ පියසටහන් පමණක් ඉතිරි කර මතක සටහන් පමණක් රැගෙන ඒමට අප ප්‍රවේසම් විය යුත්තේ මෙවැනි අගනා සම්පත් අපට මෙන්ම මතු පරපුරටත් ඉතිරි කිරීම අපේ යුතුකමක් නිසාවෙනි.

බොරැල්ල, සරණපාල හිමි මාවත, 45/95 බී, ස්ථානයේ පදිංචි බී. පුෂ්ප කුමාර වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.